# 2022 අප්‍රේල් මස මාසික සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.04.08**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | පී.එල්. චාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVIII. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIX. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | චතුමිණි විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධුර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා

ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ අප්‍රේල් මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය, මාධ්‍යවේදී රංජිත් ඩයමන් මහතා, ඒ.ඒ. ප්‍රේමදාස මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

සිංහල අලුත් අවුරුද්දත් සමඟ දීර්ඝ නිවාඩුවක් ලබා දී ඇති බැවින්, මාසික මහා සභාව එම නිවාඩුවලට පෙර පැවැත්වීම සඳහා ක්ෂණිකව තීරණය කර මහා සභාව පැවැත්වීම සඳහා කැඳවීම් ලිපි ලබා දීමට කටයුතු කරන ලදී. එසේ ක්ෂණික ලිපි ලබා දීමට සිදු වුවත්, අද දින මහා සභාව සඳහා ගරු සභිකයින්ගේ පැමිණීම වෙනුවෙන් මාගේ විශේෂ ස්තුතිය සියලුම දෙනාට පුද කරන ලදී.

මේ වන විට රට තුල දැඩි ගැටළුකාරී තත්ත්වයක් නිර්මාණය වී තිබුණද, අප සභාවේ සියලුම ගරු සභිකයින්, ජනතාව වෙනුවෙන් පෙනී සිට අවශ්‍ය තීන්දු තීරණ ලබා ගැනීම සඳහා අද දින මහා සභාවට පැමිණ ඇත. අප සභවේ සියලුම ගරු සභිකයින් පාට පක්ෂ භේද නොබලා ජනතාව වෙනුවෙන් සාමූහිකව කටයුතු කිරීම තමා සතුටු වන කරුණකි.

එසේම අප සභාවේ මිළ ගණන් කමිටුව සේම අනෙකුත් කමිටු සඳහා ද සියලුම පක්ෂ විපක්ෂ ගරු සභියකින් සහභාගී කරවා ගැනීමට කටයුතු කරමින්, එකී සියලුම කටයුතු විනිවිදභාවයකින් යුතුව සිදු කරන බව සඳහන් කළ හැකිය. මෙලෙස අප සියලුම ගරු සභිකයින් එකට එක්ව සාමූහිකව කටයුතු කිරීම අප සභාවට අභිමානයක් බවත්, අප සභාව මුළු රටටම ආදර්ශයක් බවත් ප්‍රකාශ කරන ලදී.

**(අ) (i) 2022.03.18 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.03.18 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.03.18 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>සංශෝධන</u>

I. <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

2022.03.18 මහා සභා වාර්තාවේ පිටු අංක 13 හි තම අදහස් දැක්වීම යටතේ සඳහන් අදහස, කුඹුරු වගාව සඳහා ජලය ලබා දීම සම්බන්ධයෙන් දකුණු ඉවුරෙන් ප්‍රතික්ෂේප කර ඇති බව දැන ගැනීමට ලැබුණි යනුවෙන් සංශෝධනය විය යුතුය.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. තිස්සමහාරාම, දෙබරවැව, ගඟසිරිපුර, අංක 470/3 දරණ ලිපිනය සඳහන් එස්. දූලිත ප්‍රවීන් අය විසින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට පානීය ජල බෝතල් සැපයන අතර, මේ වන විට රට තුළ පවතින ආර්ථික තත්ත්වය අනුව, පානීය ජල බෝතල් සඳහා පැවැති පාලන මිල ඉවත් කර, ගැසට් පත්‍රයක් මගින් නව මිළ ගණන් පනවා ඇති බැවින්, ආයතනය සඳහා සපයන මිලි ලීටර් 500 ජල බෝතලයක් රු. 23.00 පැවැති මිල රු. 40.00 දක්වා ඉහල දැමීමටත්, එහි විකුණුම් මිල රු. 35.00 පැවැති මිල රු. 50.00 දක්වා ඉහල දැමීමටත් සිදුව ඇති බව ලිපියක් මගින් දන්වා ඇත.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සභාවද මේ වන විට මුදල් අර්බුදයක පවතින බැවින්, මේ අවස්ථාවේ පානීය ජල බෝතලයක් රු. 50.00 ක් වැනි මුදලකට ගැනීම අපහසු කාර්යයකි. එම නිසා සභාවේ ජල අවශ්‍යතාවයන් සඳහා ලීටර් 20 ජල බෝතල් ලබා ගෙන, එමගින් අවශ්‍යතාවය සඳහා ජලය ලබා ගැනීම සුදුසු වන බව ප්‍රකශ කරන ලදී. කෙසේ වෙතත්, වෙනත් ආයතන කිහිපයකින් ජල බෝතල් සඳහා මිල ගණන් ලබා ගෙන, තබා ගන්නා ලෙසටත් තීරණය විය.</u>

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා -**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රතිපාදන මත ඉදිකරන ලද පහත සඳහන් මගී ආවරණවල 10% ක රඳවුම් මුදල්වලට අදාළ රු. 148,174.33 ක් වටිනා 450258 දරණ චෙක්පත ලැබී ඇති අතර, එම ව්‍යාපෘතීන්හි කොන්ත්‍රාත් ආයතනය වන DC-02 රුහුණු ගොවි සංවිධානය වෙත අදාළ මුදල් ගෙවීම් කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

➢ වීරවිල තුරු සෙවණ ඉදිරිපිට ඉදි කර මගී ආවරණය - රු. 15,000.00
➢ දෙබරවැව ජංගම සේවයට සමගාමීව ඉදි කළ මගී ආවරණ 05 - රු. 133,174.33

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. ජල පහසුකම් නොමැති ප්‍රදේශවලට ලීටර් 5000 ජල ටැංකි 19 ක් ස්ථිපිත කිරීම සඳහා වේදිකා සකස් කිරීමට අදාළ රු. 491,678.00 ක් වටිනා ඇස්තමේන්තුව ගරු මහා සභාවට ඉදිරිපත් කරන අතර, එකී කාර්යය සෘජු ශ්‍රමික පදනම මත සහා අරමුදලින් සිදු කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මේ වන විට සභාව විසින් නව ගම්මාන සඳහා ජල ලීටර් 115,000 කට වැඩි ප්‍රමාණයක් බෙදා දෙන බවත්, එම ප්‍රමාණය බෙදා දුන්න ද ජල අවශ්‍යතාවය ප්‍රමාණවත් නොවනු ඇත. එම නිසා මෙකී ගම්මාන සඳහා ලීටර් 5000 ජල බුලී ස්ථාපිත කිරීමට කටයුතු කළ බවත්, මෙම බුලී ස්ථාපිත කිරීම සඳහා කොන්ක්‍රීට් වේදිකා සකස් කිරීමට මෙම ඇස්තමේන්තුව සකස් කර ඇති බව ප්‍රකාශ කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. උද්ධකන්දර කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කොන්ක්‍රීට් අංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව සිමෙන්ති මිශ්‍රණය (Ready Mix) මිලදී ගැනීම වෙනුවෙන් ටොන්කා කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත 2021.12.03 දිනැති 50107 අංක දරණ බිල්පත යටතේ රු. 1,816,000.00 ක මුදලක් ගෙවීම් සිදු කිරීම සඳහා, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලැබුණු පසු ගෙවීම් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. උද්ධකන්දර කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ කොන්ක්‍රීට් අංගනය ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළව අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීම වෙනුවෙන් 2021.11.15 දිනැති 1995 අංක දරණ බිල්පත යටතේ රු. 48,485.00 ක මුදලක් ජයනි හාඩ්වෙයාර් ආයතනය වෙත ගෙවීම් සිදු කිරීම සඳහා, පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපාදන ලැබුණු පසු ගෙවීම් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. පන්නෙගමුව තොග පොළ භූමියේ සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා සිමෙන්ති බෑග් 50 ක් මිලදී ගැනීම වෙනුවෙන් යසිදු ප්ලාස්ටික් ඇන්ඩ් මෙටල්ස් ආයතනය වෙත බිල්පත් අංක 1853 හා 2022.03.23 දිනැති බිල්පත අනුව, රු. 92,500.00 ක මුදලක් ගෙවීම් කිරීමට ඇති බැවින්, එකී මුදල ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය වටා විදුලි කණු ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (L බාර් සහ GI බට) මිලදී ගැනීම වෙනුවෙන් යසිදු ප්ලාස්ටික් ඇන්ඩ් මෙටල්ස් ආයතනය වෙත 2022.03.23 දිනැති 1899 අංක දරණ බිල්පත යටතේ රු. 104,800.00 ක මුදලක් ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. තිස්සමහාරාම වැව් කණ්ඩියේ විදුලි කණු අළුත්වැඩියා කිරීම සඳහා රු. 343,200.00 කින් යුත් ඇස්තමේන්තුව ගරු මහා සභාවට ඉදිරිපත් කරන අතර, එය සෘජු ශ්‍රමික පදනම මත සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- 12 w LED Bulb - 40 Nr
- Guage 14 GI Sheet - 02 Nr
- Bulb Globe - 08 Nr

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

තිස්සමහාරාම වැව් කණ්ඩියේ සවි කර ඇති විදුලි කණු අළුත්වැඩියාව සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

✓ මෙම අලුත්වැඩියා සම්බන්ධ තොරතුරු දැන ගැනීම සඳහා ගරු සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ සහ ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභාව අවස්ථාව සඳහා කැඳවූ තාක්ෂණ සේවා නිලධාරී, එම්.ඩබ්.පී. චතුරිකා මෙනවිය විසින් ප්‍රකාශ කරන ලද්දේ, මෙහි යකඩ ප්ලේට් එකකින් බල්බය සවි කර ඇති බවත්, එම ප්ලේට් එක දිරා ගොස් ඇති නිසා, එමගින් ජලය ඇතුළට ගලා බැසීම නිසා විටින් ලාම්පු අක්‍රියවීම් සිදු වේ. එම නිසා මේ සඳහා සභාවේ යාන්ත්‍රික වැඩපල මගින් අලුතින් ප්ලේට් ගැසීමට කටයුතු කර, මෙම බල්බය උඩට සිටින සේ සවි කිරීමට කටයුතු සැලසුම් කර ඇති බවත්, එමගින් බල්බය ආරක්ෂා කර ගැනීමට හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාවක් බවට පත් විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. මාගම අක්කර 20 මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම සඳහා ද්‍රව්‍ය ලැයිස්තුව ඉදිරිපත් කරන අතර, ඒ සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- 4 විශ්කම්භය සහිත හියුම් පයිප්ප - 12 ft
- සිමෙන්ති (50 kg Bag) - 20 Nr
- වැලි - 1 ¼ Cube
- ¾'' ගල් - 1 ¼ Cube
- ABC - 1.0 Cube
- 6'' පළල ලෑලි - 100 ft
- 2'' Dia Water Pump (Rent) - 2.0 Day

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. 2017 වර්ෂයේ සිට නොදන්වා සේවය අතහැර ගොස් සිටින ඊ.පී.ආනන්ද මහතාගේ හිඟව පවතින රු.10,000.00 ක උත්සව අත්තිකාරම් සහ රු.2,800.00 ක විශේෂ අත්තිකාරම් ශේෂය මේ වන තෙක් අයකර ගැනීමට නොහැකි වී ඇත. එම නිළධාරියා ස්ථිර සේවකයකු බැවින් ණය ලබා දීමේ දී ඇපකරුවන් අවශ්‍ය වී නොමැති බැවින් හා ඔහු මේ වන විට අතුරුදහන් වී ඇති බැවින් අය කර ගත නොහැකිව ඇති එම රු.12,800.00 ක හිඟ ශේෂය ආදායමින් කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීම සඳහා ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතුව පැවති බැංකු ගිණුම් 02 ක් වසර ගණනාවක් ගණුදෙනු නොකිරීම මත අක්‍රීය වී ඇත.

| බැංකුව | ගිණුම් වර්ගය | ගිණුම් අංකය | දැනට පවතින ශේෂය (රු.) |
|---|---|---|---|
| මහජන බැංකුව (තිස්සමහාරාම ශාඛාව) | ජංගම (මාගල ව්‍යාපෘතිය) | 061-1-001-9-5074040 | 4,822.82 |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව (තිස්සමහාරාම ශාඛාව) | ඉතිරි කිරීම් | 1-0097-01-73495 (2020.10.31 දක්වා පමණක් පොළී ගණනය කර ඇත) | 248,039.09 |

මහජන බැංකුවේ ඇති ජංගම ගිණුමේ රු.4,822.82 ක ශේෂය තිස්මහාරාමේ ලංකා බැංකුවේ පවත්වා ගෙන යනු ලබන 3328195 අංක දරණ පොදු ගිණුම වෙත මාරු කිරීමටත්, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ඉතිරි කිරීමේ ගිණුම ඉවත් කර, එම මුදල තැන්පත් කොට ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කිරීමටත් ගරු මහ සභාවට යෝජනා කරමි. තවදුරටත්, එම නව ඉතිරි කිරීමේ ගිණුම වෙත ආයෝජනයක් ලෙස දෛනිකව 3328195 දරණ පොදු ගිණුමෙන් රු.10,000.00

බැගින් මාසිකව රු.300,000.00 ක මුදලක් ස්ථාවර නියෝගයක් හරහා සෘජු ප්‍රේෂණ මගින් මාරු කිරීමටත් ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

මාගල ගිණුම සක්‍රීයව පැවැති ගිණුමකි. අප පාලන කාලය තුළ සභාවේ ස්වයං උත්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් ආරම්භ කළ ගිණුමක් වන බැවින්, එවැනි ස්වයං උත්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් ආරම්භ කළ ගිණුම අක්‍රීය කිරීම පිළිබඳව එකඟ නොවනු ඇත. එම නිසා මෙම ගිණුම සක්‍රීය කර නැවත ස්වයං උත්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම කටයුතු කරන්නේ නම් එය වඩාත් යෝග්‍ය බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

ස්වයං උත්පාදන ව්‍යාපෘතියක් වෙනුවෙන් ආරම්භ කළ ගිණුම එවකට තිබූ දේශපාලන පක්ෂයක් විසින් ඇති කර ගත් එකකි. නමුත් මේ වන විට එකී ගිණුම් සක්‍රීය තත්ත්වයේ නොමැති බැවින්, එම ගිණුම් වසා දැමීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>

අප ආයතනය වෙත යොමු කරන ලද විගණන වාර්තාවල පිටපත් සියලුම ගරු සභිකයින් වෙත ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ප්‍රාදේශීය සභාව තුළ පවතින ගිණුම්වලින් ගණුදෙනු නොකිරීම නිසා, එම ගිණුම වසා දමා එහි පවතින මුදල් වෙනම ගිණුමක තැන්පත් කරන ලෙසට විගණන කළමනාකරණ කමිටුවේ දී දන්වා ඇත. එසේ සිදු නොකලහොත් යම් දිනක අධි භාර විය හැකිය. එම නිසා විගණන දෙපාර්තමේන්තුව විසින් අප වෙත දන්වන ලද කරුණු ක්‍රියාත්මක කිරීම කළ යුතුය. ඒ හේතුව මතම මෙම ගිණුම් දෙක අක්‍රීය කිරීමට තීරණය කළ බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>එසේම 2018 වර්ෂයේ සිට අප පාලන කාලය ආරම්භ වූ දින සිට සත්‍ය නිවැරදි ගිණුම්කරණයක් කර ඇති බවට විගණන දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇත.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

11. පන්නගමුව තොග පොළ භූමිය සංවර්ධනය කිරීම සඳහා මීට ඉහත දී කැටගල් 12000 ක ප්‍රමාණයක් මිලදී ගෙන සංවර්ධනය කටයුතු සිදු කළ අතර තවත් කැටගල් 7000 ක ප්‍රමාණයක් අවශ්‍ය වී ඇත. එබැවින් එම කැටගල් ප්‍රමාණය මිලදී ගැනීම සුදුසු බව මෙම ගරු මහ සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. ප්‍රාදේශීය සභාව සතු PF – 7365 දරණ කැබ් රථය සඳහා 265x70x16 ප්‍රමාණයේ Dunlop Japan වර්ගයේ ටයර් 04ක් 2021.02.11 දින මාරු කරන විට මීටරය දැක්වූවේ 365443 km වේ. 2022.04.04 වන දින වන විට මෙහි මීටරය 431386 km වේ.

මේ වන විට 65943 km ධාවනය කර ඇත. එබැවින් මෙම රථය සඳහා 265x70x16 ප්‍රමාණයේ ටයර් 04 ක් මිළදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මිලදී ගැනීම් කමිටුව හරහා සුදුසුම ටයර් වර්ගයක් මිලදී ගැනීම සුදුසු බවට දන්වන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

13. ප්‍රාදේශීය සභාව සතු MG-330 මෝටර් ග්‍රේඩරය සඳහා Gear Wheel 01 ක් මිළදී ගැනීම වෙනුවෙන් නිට්ටඹුවේ, ජේ.එම්. ඉන්ඩ්‍රස්ට්‍රීස් ඇන්ඩ් සප්ලයර්ස් ආයතනය සඳහා රු. 93200.00 ක් වටිනා බිල්පත් වෙනුවෙන් ගෙවීම් අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාව යෝජනා කරමි.

<u>උප ලේඛනය</u>

ගෙවීම් විස්තරය

| අනු අංකය | විස්තරය | ගෙවනලද/ගෙවීමට ඇති ආයතනය | බිල්අංකය සහ දිනය | මුදල (රු.) |
|---|---|---|---|---|
| I | MG-330 මෝටර් ග්‍රේඩරය සඳහා Gear Wheel 01 ක් මිළදී ගැනීම | ජේ.එම්. ඉන්ඩ්‍රස්ට්‍රීස් ඇන්ඩ් සප්ලයර්ස් ආයතනය, කොස්රුප්පාවත්ත, එල්ලක්කල, නිට්ටඹුව. | 262-2022.04.02 | 70,865.00 |
| II | සභාවේ ජෙනරේටරය අලුත්වැඩියා කිරීම | ක්‍රිෂාන්ත ඉලෙක්ට්‍රිකල්ස් | 1073 2022.04.07 | 132,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

14. සභාව සතු රථවාහන සඳහා ලබා ගත් රක්ෂණය 2022.05.14 දිනෙන් අවසන් වේ. එබැවින් සභාව සතු රථවාහන සඳහා ඉදිරි වර්ෂයක කාලයට රක්ෂණය ලබා ගැනීමට අදාළ රක්ෂණ ආයතනවලින් මිළ ගණන් කැඳවීමටත්, ඉදිරි කටයුතු කිරීමටත් සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

| අනු අංකය | වාහනය/යන්ත්‍රෝපකරණය කුමක්ද යන වග | ලියාපදිංචි අංකය | වටිනාකම | රක්ෂණයේ ස්වභාවය |
|---|---|---|---|---|
| 1 | ඩබල් කැබ් රථය | WP-PF-7365 | 6,000,000.00 | පූර්ණ රක්ෂණය |
| 2 | ඩබල් කැබ් රථය | 56-1099 | 1,500,000.00 | පූර්ණ රක්ෂණය |
| 3 | ගාබේජ් කම්පැක්ටරය | SP-LM-5616 | 12,580,000.00 | පූර්ණ රක්ෂණය |
| 4 | ටිපර් රථය | SP-LA-1438 | 1,000,000.00 | තුන්වන පාර්ශවය |
| 5 | ටිපර් රථය | SP-LA-1440 | 1,000,000.00 | තුන්වන පාර්ශවය |
| 6 | යතුරු පැදිය | SP-HX-9717 | 45,000.00 | තුන්වන පාර්ශවය |
| 7 | මහ ට්‍රැක්ටරය | SP-RD-9489 | 1,150,000.00 | තුන්වන පාර්ශවය |
| 8 | ටිපර් රථය | SP-LL-6981 | 2,000,000.00 | තුන්වන පාර්ශවය |

| | | | | |
|---|---|---|---|---|
| 9 | ජල බවුසරය | SP-LL-7379 | 1,850,000.00 | තුන්වන පාර්ශවය |
| 10 | මහ ට්‍රැක්ටරය | SP-RD-4489 | 1,100,000.00 | තුන්වන පාර්ශවය |
| 11 | මහ ට්‍රැක්ටරය | WP-RD-8051 | 1,250,000.00 | තුන්වන පාර්ශවය |
| 12 | ටිපර් රථය | SP-LA-1442 | 1,000,000.00 | තුන්වන පාර්ශවය |
| 13 | ජල බවුසරය | 227-5807 | 1,200,000.00 | තුන්වන පාර්ශවය |
| 14 | මහ ට්‍රැක්ටරය | SP-JA-6203 | 650,000.00 | තුන්වන පාර්ශවය |
| 15 | FOTON බැකෝ ලෝඩරය | ZA-5200 | 9,000,000.00 | තුන්වන පාර්ශවය |
| 16 | බැකෝ ලෝඩරය | JS - 9860 | 3,000,000.00 | තුන්වන පාර්ශවය |
| 17 | මෝටර් ග්‍රේඩරය | MG - 330 | 8,746,000.00 | තුන්වන පාර්ශවය |
| 18 | FUSO බවුසරය | LO- 3589 | 1,200,000.00 | තුන්වන පාර්ශවය |
| 19 | මහින්ද්‍රා බොලේරෝ කැබ් රථය | LE -7462 | 1,300,000.00 | තුන්වන පාර්ශවය |
| 20 | අත් ට්‍රැක්ටරය | 75-3724 | 100,000.00 | තුන්වන පාර්ශවය |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

15. කාර්යාලයේ සෞඛ්‍ය අංශයට අවශ්‍ය කරන රෙදි මිශ්‍ර රබර් අත් ග්ලවුස් ජෝඩු 450 ක් කාර්යාලයේ ගබඩාවට මිලදී ගැනීම වෙනුවෙන් 2022.03.21 දිනැති 37318 අංක දරණ බිල්පත සඳහා රු. 72,000.00 ක මුදලක් සී/ස ගුණවර්ධන සහ පුද්ගලික සමාගම වෙත ගෙවීම් කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. දිනපතා දහවල් කාලය තුළ සිදු කරන විදුලි කප්පාදුව හේතුවෙන් කාර්යාලයේ පවතින දැඩි අඳුර නිසා දෛනික රාජකාරී කටයුතු සිදු කර ගෙන යාම අපහසු වී ඇති බැවින්, එයට විසඳුමක් ලෙස විදුලි ජනක යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු සඳහා පහත විදුලි උපකරණ මිලදී ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- 16 mm විශ්කම්භය සහිත 1 කෝර් වයර් (නිල්) - 35 m (ACL / Orange)
- 16 mm විශ්කම්භය සහිත 1 කෝර් වයර් (දුඹුරු) - 105 m (ACL / Orange)
- 60 A Manual 4 Pole Change Over Swich - 01 Nr (krypton / Orange)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

ජෙනරේටරයක් අප පාලන කාලයේ තිබියදී, අස්ථානගත වී යැයි පවසන ප්‍රකාශ වැරදිය. අප පාලන කාලය තුළ යම් කාර්යය සිදු කිරීමට අවශ්‍ය වු විටක පිටතින් ජෙනරේටරයක් ගෙන එම කාර්යය සිදු

කරන ලදී. අප පාලන කාලය තුළ පරිත්‍යාගයක් ලෙස ජෙනරේටරයක් ලැබී තිබුණේ නම්, එය ආයතනයේ ලේකම් වෙත භාර දිය යුතුය. පරිත්‍යාග ලෙස ජෙනරේටරයක් නොලැබුණු නිසාවෙන් එය ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් නොවී ඇති බව ප්‍රකාශ කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

ආදාහනාගාරය සඳහා ද ජෙනරේටරයක අවශ්‍යතාවය පවතී. මේ අවස්ථාවේ පවතින ආර්ථික තත්ත්වය හමුවේ එම මධ්‍යස්ථානය සඳහා ජෙනරේටරයක් ලබා ගැනීමට නොහැකි වුවත්, මිල ගණන් පහල යාමක් සිදු වූ පසුව, මිල ගණන් කැඳවා ජෙනරේටරයක් මිලදී ගැනීමට තීරණය විය.

ජනතා විමුක්ති පෙරමුණ කාලයේ අප ආයතනයට පරිත්‍යාග ලෙස ජෙනරේටරයක් ලැබී තිබුණේ ද යන්න දිස්ත්‍රික් ලේකම් වෙතින් තොරතුරු දැන ගැනීම සඳහා ලිපියක් යොමු කිරීමට තීරණය විය.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

17. 2021.12.31 දිනට අදාළ ස්ථාවර වත්කම් සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තා ගත කර ඇති අතර, එම වාර්තාව පිළිගැනීම සඳහා මෙම ගරු සභාව යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

18. 2020 ජනවාරි 01 දින සිට තිස්සමහාරාම මහසෙන්පුර ආදාහනාගාරයේ එක් ආදාහනයක් සඳහා අය කරනු ලබන ගාස්තුව, බල ප්‍රදේශයේ ආදාහනයක් වෙනුවෙන්, රු.7,500 .00 ක් ද, බල ප්‍රදේශයෙන් පිටත ආදාහනයක් වෙනුවෙන් රු. 8,500 .00 ක් ද වන ලෙසට අය කළ අතර, 2020 ගැසට් පත්‍රයට අනුව මෙලෙස ආදාහනාගාර ගාස්තු ඉහල දැමීම සිදු කරන විට, කි.ග්‍රෑ. 37.5 ක ගෑස් සිලින්ඩරයක මිල රු. 6,135.00 ක් ලෙස පැවතුන බවත්, එම කාලය තුළ කිසිදු විදුලි අර්බුධකාරී තත්ත්වයක් ද මතු නොවීය. නමුත්, දැනට කි.ග්‍රෑ. 37.5 ක ගෑස් සිලින්ඩරයක මිල රු. 13,103.00 ක් ලෙස ඉහල යාමත්, විදුලි අර්බුධය නිසා ආදාහන සිදු කිරීමට ජෙනරේටරයක් යොදා ගැනීම වෙනුවෙන් දෛනිකව රු. 6,000.00 ක මුදලක් ගෙවීමට සිදු වන බැවින්, 2022.05.01 දින සිට පහත පරිදි ආදාහන ගාස්තු වැඩි කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| ආදාහනයක් සඳහා වැය වූ මුදල (රු) | | ජෙනරේටරය සඳහා දෛනිකව ගෙවිය යුතු මුදල (රු) (විදුලි අර්බුදය නිසා) | දැනට බල ප්‍රදේශය තුළ ආදාහනයක් වෙනුවෙන් අය කරන මුදල (රු) | | ආදාහනයක් වෙනුවෙන් අය කරන ලද යෝජිත මුදල (රු) | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | පෙබරවාරි | | බල ප්‍රදේශය තුළ | බල ප්‍රදේශයෙන් පිටත | බල ප්‍රදේශය තුළ | බල ප්‍රදේශයෙන් පිටත |
| 11,951.21 | 16,676.24 | 6,000.00 | 7,500.00 | 8,500.00 | 16,000.00 | 20,000.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

අනෙක් සභාවල ද ආදාහන සඳහා අය කරනු ලබන ගාස්තු පිළිබඳ වාර්තාවක් ලබා ගෙන මෙකී යෝජනාව ලබන මහා සභාවට නැවත ඉදිරිපත් කිරීම සුදුසුය. නැතහොත් තිස්සමහාරාමයේ පමණක් මෙලෙස ආදාහනාගාර ගාස්තු වැඩි කළහොත්, එය තිස්සමහාරාමයේ ජනතාවට සිදු කරන අසාධාරණයකි.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා</u>

ආදාහන කටයුතු සිදු කිරීම ප්‍රාදේශීය සභාවක් විසින් ජනතාවට සිදු කරනු ලබන සේවාවකි. එම නිසා සභාවක් ලෙස ජනතාවට සේවා සැපයීමේ දී ජනතාවට දරා ගත හැකි වන පරිදි ගාස්තුවක් නියම කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ආදාහනාගාර ගාස්තු වැඩි කිරීම සම්බන්ධයෙන් අද දින විවිධ අදහස් දැක්වූ බැවින්, ආදාහනයක් සඳහා වෙනත් සභාවලින් අය කරනු ලබන ගාස්තු පිළිබඳ වාර්තාවක් ලබා ගෙන, එකී ගාස්තු සමඟ මෙම යෝජනාව නැවත ඊළඟ මහා සභාවට ඉදිරිපත් කිරීමට තීරණය විය.</u>

<u>සභාවක් ලෙස අප ජනතාවට සේවා සපයන ආයතනයකි. නමුත් මේ දිනවල ගෑස් මිල ඉහළ යාමත් සමඟ ආදාහනයක් සඳහා අය කරනු ලබන මුදලට වඩා විශාල මුදලක් වැය කිරීම සිදු වේ. මෙසේ වැය වන මුදල සභාවක් ලෙස දරා ගත නොහැකි වන දෙයක් නිසා, එකඟ විය නොහැකි වුවත් ආදාහනාගාර ගාස්තු වැඩි කිරීමට තීරණය කළ බව ප්‍රකාශ කරන ලදී.</u>

<u>තිස්සමහාරාමයේ ජනතාවගේ බදු මුදල්වලින් අප සභාව විසින් ජනතාව වෙත සේවා සපයනු ලබයි. අප ආයතනයේ ආදාහනාගාරයෙන් කතරගම, ලුණුගම්වෙහෙර, තණමල්විල, හම්බන්තොට යන ප්‍රදේශවලින් ද සේවා ලබා ගනු ලබයි. එම නිසා තිස්සමහාරාම බල ප්‍රදේශයේ ජනතාවට සහනයක් ලබා දීම සඳහා ගාස්තු තීරණය කිරීමටත්, පිටත ආදාහනයක් වෙනුවෙන් අය කරනු ලබන ගාස්තු තීරණය කිරීමත් අප සියලුම දෙනා විසින් සිදු කළ යුතුය.</u>

<u>අලුත් අවුරුදු නිවාඩුවෙන් පසුව මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ලබා ගෙන, ඊළඟ මස මහා සභාවට මේ සම්බන්ධ වාර්තාව ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.</u>

- ගරු උප සභාපති - සුදත් විදානගමගේ මහතා
- ගරු ප්‍රාදේශීය සභා සභික - එල්.එච්. කුමුදු සුජීව මහතා
- ගරු ප්‍රාදේශීය සභා සභික - කේ.එච්. ගාමිණී මහතා
- ගරු ප්‍රාදේශීය සභා සභික - ඩබ්.කේ. ටෂිත සමිල මහතා
- ගරු ප්‍රාදේශීය සභා සභික - පී.කේ. ආරියසේන මහතා
- ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා
- ලේකම් - ඩී. රුවිනා දීපානි මිය
- සංවර්ධන නිලධාරී - ටී.එච්. සචිත්‍රා ප්‍රසාදනී මිය
- තාක්ෂණ සේවා නිලධාරී - එල්.පී. ජගත් කුමාර මහතා
- කළමනාකරණ සේවා නිලධාරී - බී.කේ. ධම්මික සම්පත් මහතා

එම යෝජනාවට අදාළ තොරතුරු ලබා ගනිමින්, මෙම යෝජනාව නැවත ලබන සභාවට ඉදිරිපත් කිරීමට සියලුම දෙනාගේ එකඟතාවය මත තීරණය විය.

19. ගලි බවුසරය සඳහා 2022 වර්ෂයට ගැසට් වු මුදල කි.මී 30ක් දක්වා පහත මිල ගණන් වන අතර, ඉන්ධන මිල ඉහල යාමත් සමග ගලි බවුසරය සඳහා සේවා ගාස්තු 2022.05.01 දින සිට පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| කි.මි. 30 සඳහා | පවතින ගාස්තුව | කි.මි. 30 සඳහා වැඩිවීම | නඩත්තු සඳහා වියදම | නව ගාස්තුව |
|---|---|---|---|---|
| නේවාසික | රු. 5800.00 | 412 | 580 | රු. 6800.00 |
| වානිජ | රු. 7800.00 | 412 | 580 | රු. 8800.00 |
| බල ප්‍රදේශයෙන් පිටත | රු. 8300.00 | 412 | 580 | රු. 9300.00 |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී

❖ <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>ගලි බවුසරය මගින් ගලි වළවල් මෙන්ම අප ජලය වළවල්ද ඉවත් කිරීම සිදු කරනු ලැබුවද, ඒ සඳහා වැයවන ඉන්ධන වියදම එකම ප්‍රමාණයක් වන බැවින්, ගලිවළවල් සහ අපජලය වළවල් යන සේවා දෙකම සිදු කිරීම සඳහා ඉහත නව ගාස්තුවම අය කිරීම සුදුසු බවට සඳහන් කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

20. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථාන වල පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | කඩ කාමර අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 1 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ ඉදිරිපිට නව කඩ කාමරය | 01 සී | ජේ.එම්.කේ. ප්‍රියංකා කුමාරි | එම්.එන්.එච්. සුනිල් ජයන්ත | එක්වත් මුදල ගෙවා |
| 3 | දෙබරවැව පොදු වෙළඳපොළ | 09 | යද්දෙහිගුරුගේ කුලසිරි | යද්දෙහි ගුරුගේ සජනා දෙව්මිණි | පියාගෙන් දියණියට |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජී. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ජී. ගයාන් සඳරුවන් මහතා**</u>

තිස්සමහාරාම නගරය බදු අයිතිය ලබා ගෙන ඇති සභාව සතු කඩ කාමරයන්හි අතුරු බදුදීම් සිදු කර ඇති කඩ කාමර බොහොමයක් තිබෙන බවට කරුණු දැන ගැනීමට ලැබී ඇත. නව වෙළඳ සංකීර්ණය තනි මහල් වෙළඳසැලේ අංක 31 කඩ කාමරයේ බදු අයිතිය සෝමදාස යන අය ලබා ගෙන ඇති නමුත්, මේ වන විට එම කඩ කාමරය සුපුන් යන අය විසින් පවත්වාගෙන යන බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කරන ලෙසට දන්වා සිටින ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණි මහතා**</u>

සභාව සතු කඩ කාමර බදු අයිතිය ලබා ගෙන ඇති බදුකරුවන් එකී කඩ කාමර අතුරු බදු දීම් සිදු කර ඇත්ද යන්න ආදායම් පරීක්ෂක නිලධාරී යොදවා සොයා බැලීම් සිදු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>නව වෙළඳ සංකීර්ණය තනි මහල් වෙළඳසැලේ අංක 31 කඩ කාමරයේ බදු අයිතිය ලබා ගෙන ඇති පුද්ගලයා විසින් එම කඩ කාමරය අතුරු බදු දීමක් සිදු කර ඇත්ද යන්න ආදායම් පරීක්ෂක නිලධාරී විසින් සොයා බලා වාර්තාවක් ලබා ගෙන, එකී ගිවිසුම අවලංගු කර, එම කඩ කාමරය නැවත සභාවට ලබා ලබා ගෙන, වෙනත් පුද්ගලයෙකු සඳහා බදු අයිතිය ගිවිසුම් ප්‍රකාරව ලබා දීමට තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

21. කාර්යාලයේ පවතින ගිණි නිවීමේ උපකරණ 07 පූර්ණ නඩත්තු කිරීම සඳහා Britex Safety House ආයතනයෙන් රු. 15,700.00 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බැවින්, කාර්යාලයේ ගිණි නිවීමේ උපකරණ 07 පූර්ණ නඩත්තු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

22. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාළව, වෙන්දේසි කළ යුතු භාණ්ඩ 2022.03.30 වන දින ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කළ අතර, ඊට අදාළ වෙන්දේසි වාර්තාව අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

23. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට අදාළව, අපහරණය යුතු භාණ්ඩ 2022.03.29 වන දින අපහරණය කළ අතර, ඊට අදාළ අපහරණ වාර්තාව අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

24. ඉන්ධන මිළ ඉහළ යාම හා වාහන අමතර කොටස්වල මිල ඉතා සීඝ්‍රයෙන් ඉහළ යාම නිසා අප සභාව විසින් ගෙවීමේ පදනම මත ලබා දෙන වාහන හා යන්ත්‍ර සූත්‍ර සඳහා අය කරනු ගාස්තු 2022.05.01 දින සිට සංශෝධනය කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**<u>දැනට පවතින ගාස්තුව හා වියදම්</u>**

| | වාහන අංකය | වාහනය | මීටර් පැය එකකට අය කරන මුදල (රු) | සංශෝධනය කරමින් මීටර් පැය එකකට අය කිරීමට නියමිත මුදල (රු) |
|---|---|---|---|---|
| 1 | MG-330 | මෝටර් ග්‍රේඩරය | රු. 5000.00 (පැයකට) | රු. 6,000.00 (පැයකට) |
| 2 | ZA-5200 | බැකෝ ලෝඩරය (FOTON) | රු. 3000.00(පැයකට) | රු. 3,750.00 (පැයකට) |
| 3 | JS-9860 | බැකෝ ලෝඩරය (CAT) | රු. 3000.00(පැයකට) | රු. 3,750.00 (පැයකට) |
| | ටොන් 8-10 රෝල | | රු. 4000.00(පැයකට) | රු. 4,800.00 (පැයකට) |
| | LL-6981 | කියුබ් 2 ½ ටිපර් රථය | - | රු. 15,000.00 (දිනකට) |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය

- ❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

25. සභාව සතු මෝටර් ග්‍රේඩරය ට්‍රාන්ස්මිෂන් යුනිට් එක ගලවා, අලුත් රේසර් පිට් කිරීම, රේඩියේටරය ගලවා කූල් ෆෑන් ගියර් වීල් එක හා ක්ලච් ෆාප්ට් වීල් එක අලුතින් දැමීම හා බ්ලේඩ් එකේ දෙපැත්ත කටර් කර අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ආරියපාල ඔටෝ ඉංජිනියර්ස් ආයතනයට ගෙවීමට ඇති බිල් අංක 7884 හා 2022.04.05 දිනැති රු. 66,800.00 ක් වටිනා බිල්පත පියවීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

26. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් උද්ධකන්දර කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කටයුතු, එම මධ්‍යස්ථානයේ නිෂ්පාදනය කරනු ලබන පොහොර සම්බන්ධ කටයුතු සහ නගර අංලකරණ කටයුතු කාර්යක්ෂවම සහ වැඩි ඵලදායිතාවයකින් යුතුව සිදු කරමින් ජනතාවට වැඩි සේවාවන් ලබා දීම සඳහාත්, එකී කටයුතුවල ඵලදායිතාවය ඉහල නංවාලීම සඳහාත්, එකී කටයුතු පිළිබඳ පසු විපරම් සිදු කරමින්, විධිමත්ව සිදු කර ගැනීම සඳහා අවශ්‍ය කරන සියලු කටයුතු සිදු කිරීමටත්, එකී සෑම කටයුත්තක් සඳහාම අදාළ ලිපි ලේඛන නඩත්තු කිරීමේ රාජකාරී කටයුතු නිසියාකාරව සහ කාර්යක්ෂවම සිදු කර ගැනීමේ අවශ්‍යතාවය මතුව ඇති බැවිනුත්,

සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවල කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කටයුතු සහ නගර අලංකරණට අදාළ වැඩසටහන් අඛණ්ඩව සිදු කිරීම සඳහාත්, එකී නිවාඩු දිනයන්හි සේවා ලබා ගැනීම සඳහා ආයතනයට පැමිණෙන ජනතාවට අඛණ්ඩව සේවාවන් ලබා දීම සඳහාත්, උද්ධකන්දර කොම්පෝස්ට් මධ්‍යස්ථානයේ පුරප්පාඩුව පවතින වැඩ/ක්ෂේත්‍ර කම්කරු තනතුරු 02 ක් සඳහා දැනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිටින එච්.එම්. දිලිනි සංජීවනී මහත්මිය සහ එස්.ඒ.කේ. හිරුණි මලීෂා මහත්මිය 2022.04.01 දින සිට ස්ථිර වශයෙන් යොදවා ගෙන, එකී කටයුතු කාර්යක්ෂමව සිදු කර ගැනීමට කටයුතු කළ අතර, ඒ සඳහා මහා සභාවේ ද එකඟතාවය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

- ❖ **<u>අදහස් දැක්වීම - ගරු උප සභාපති සුදත් විදානගමගේ මහතා</u>**

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් උද්ධකන්දර කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානය මගින් කොම්පෝස්ට් පොහොර නිසි ප්‍රමිතියකින් යුතුව නිෂ්පාදනය කරමින් ප්‍රදේශයේ ජනතාවට ලබා දීමට කටයුතු කිරීම ජනතාව වෙනුවෙන් සිදු කරනු ලබන සේවාවකි. ඒ අතර නිසි ප්‍රමිතියකින් හා ගුණාත්මකභාවයකින් යුතුව නිෂ්පාදනය කරනු ලබන පොහොර ජනතාව අතරට රැගෙන යාමේ වැඩසටහන් සිදු කිරීම, ප්‍රදේශයේ පාසල් 10 ක් තෝරා ගනිමින් දීර්ඝ වශයෙන් ආදර්ශවත් ගෙවතු 10 ක් සකස් කිරීම, නගර අංලකරණ කටයුතුවලදී තිස්සමහාරාම, දෙබරවැව, සඳුන්ගම වට රවුම් ආදියේ මල් පාත්ති නඩත්තු කටයුතු කිරීම ආදිය අප සභාව විසින් සිදු කළ යුතු බැවින්, එකී කටයුතු පසු විපරමකින් යුතුව නිසියාකාරව සහ කාර්යක්ෂමව සිදු කිරීම සඳහා, අලුතින් සේවකයින් බඳවා නොගෙන, දැනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතුව සිටින එච්.එම්. දිලිනි සංජීවනී මහත්මිය සහ එස්.ඒ.කේ. හිරුණි මලීෂා මහත්මිය 2022.04.01 දින සිට ස්ථිර වශයෙන් එකී කාර්යයන්වලට අදාළ කටයුතු සිදු කිරීම සඳහා යොදවා ගැනීමට කටයුතු කිරීම වඩාත් සුදුසු වන බවත්, මෙම සේවකයින් දෙදෙනා සථිර වශයෙන් උද්ධකන්දර කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයේ කටයුතු සහ නගර අලංකරණ කටයුතු සිදු කිරීමට අවශ්‍ය වන කටයුතු සිදු කිරීම සඳහා යොදවා ගැනීමෙන් අප ආයතනය විසින් ජනතාවට ලබා දිය යුතු සේවාව ඵලදායිතාවයකින් යුතුව කාර්යක්ෂමව ලබා දීමට හැකියාව පවතින අතර, එකී කටයුතු සිදු කිරීම සඳහා අද දින ගෙන එන ලද යෝජනාව සුදුසු කාලෝචිත යෝජනාවක් වන බවත් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

27. පන්නෙගමුව සති පොළ භූමිය කැටගල් යොදා සංවර්ධනය කිරීම සඳහා 2021 දෙසැම්බර් මස යොදවා ගත් පුහුණු නුපුහුණු ශ්‍රමිකයින් වෙත පහත පරිදි රු. 172,800.00 ක මුදලක් ගෙවීම් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | ශ්‍රමික දින ගණන | එක් දිනකට වැටුප | මුළු මුදල (රු) |
|---|---|---|---|
| පුහුණු | 32 | රු. 2,900.00 | රු. 92,800.00 |
| නුපුහුණු | 40 | රු. 2,000.00 | රු. 80,000.00 |
| | | **මුළු එකතුව** | **රු. 172,800.00** |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

28. පන්නෙගමුව සති පොළ භූමිය කැටගල් යොදා සංවර්ධනය කිරීම සඳහා 2022 මාර්තු මස යොදවා ගත් පුහුණු නුපුහුණු ශ්‍රමිකයින් වෙත පහත පරිදි රු. 111,900.00 ක මුදලක් ගෙවීම් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | ශ්‍රමික දින ගණන | එක් දිනකට වැටුප | මුළු මුදල (රු) |
|---|---|---|---|
| පුහුණු | 11 | රු. 2,900.00 | රු. 31,900.00 |
| නුපුහුණු | 40 | රු. 2,000.00 | රු. 80,000.00 |
| | | **මුළු එකතුව** | **රු. 111,900.00** |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>**

29. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සඳහා අලුතින් ඉදි කරනු ලබන බහුකාර්ය ගොඩනැගිල්ලේ බිම් මහලේ කඩ කාමර මේ වන විට ඉදි කර අවසන්ව ඇති අතර, එකී කඩ කාමර බදු අයිතිය ලබා දීම සඳහා ක්‍රමවේදයක් සකස් කර, එය බදු දීමට කටයුතු කළහොත් සභාවට ආදායම් ලබා ගත හැකි බැවිනුත්, මෙම කඩ කාමර ටෙන්ඩර් පටිපාටිය යටතේ ටෙන්ඩර් කර, එම ආදායමින් නව සභා ගොඩනැගිල්ල පාටිෂන් කර ගැනීමට හැකියාව පවතින බැවිනුත්, මෙකී කඩ කාමර ටෙන්ඩර් පටිපාටියට අනුව, ටෙන්ඩර් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>**

ඉදිරි උත්සව සමයත් සමඟ කඩ කාමර ඉල්ලුම් කිරීම වැඩි වශයෙන් සිදු වන බැවින්, මෙම කඩ කාමර කඩිනමින් ටෙන්ඩර් කිරීම සුදුසු වනු ඇත.

- **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා</u>**

සභා කාර්යාලය නව ස්ථානයට ගෙන යාම සම්බන්ධයෙන් සහ කඩ කාමර ටෙන්ඩර් කිරීම සම්බන්ධයෙන් තමා කිසිදු විරුද්ධත්වයක් නොමැත. නමුත්, මේ අවස්ථාවේ මෙකී කඩ කාමර ටෙන්ඩර් කළහොත් ඒවා ඉල්ලුම් කරනු ලබන්නේ ව්‍යාපාරික ජාවාරම්කරුවන් පමණකි. මේ අවස්ථාවේ රටේ පවතින ආර්ථික තත්ත්වයත් සමඟ අසරණ මිනිසෙකුට මෙවැනි කඩ කාමරයක් බදු ලබා ගැනීමට හැකියාවක් නොමැත. මෙකී කඩ කාම බදු දුන්පසුවත් සිදුවන්නේ ද කඩ කාමර අතුරු බදු දීමය. එම නිසා අහිංසක මිනිසාගේ ද ආර්ථිකය ගොඩනැගුණු පසුව මෙකී කඩ කාමර ටෙන්ඩර් කළ හැකි නම්, මෙකී කඩ කාමර බදු අයිතිය ලබා ගැනීම තිස්සමහාරාමයේ අහිංසක ජනතාවට ද හැකියාව පවතින බව ප්‍රකාශ කර සිටින ලදී.

- **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>තක්සේරු දෙපාර්තමේන්තුව මගින් මෙම කඩ කාමර සඳහා තක්සේරුවක් ලබා ගෙන, කඩ කාමර ටෙන්ඩර් කිරීම සුදුසු වන බවත්, මෙම කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා ගරු දකුණු පළාත් ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.</u>

<u>එසේම, ප්‍රාදේශීය මිල ගණන් යටතේ මෙකී කඩ කාමර සඳහා ටෙන්ඩර් කැඳවා එක්වන් මුදල පාදක කර ගනිමින් කඩ කාමර ටෙන්ඩර් කිරීම සුදුසු බවටත් තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

- **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා</u>**

30. දෙබරවැව පොදු ක්‍රීඩාංගනයේ 2022.01.31 වන තිස්සමහාරාම, දෙබරවැව, රෙගී සවුන්ඩ් ආයතනයේ ආරියවංශ පතිනායක මහතා විසින් පවත්වනු ලැබූ සංගීත ප්‍රසංගය නිසාවෙන් දෙබරවැව පොදු ක්‍රීඩාංගනය සඳහා සිදු වූ හානිය ඔහු විසින් සකස් කර දීමට එකඟ වී ඇති බැවින්, ක්‍රීඩාංගනයට සිදු වූ හානිය සකස් කර දුන් පසුව, ඒ පිළිබඳව තාක්ෂණ සේවා නිලධාරීගේ වාර්තාවන් ලබා ගෙන, එකී සංගීත ප්‍රසංගය සඳහා ඔහු විසින් සභාවේ තැන්පත් කරන ලද ඇප තැන්පතු මුදල් නිදහස් කිරීමට කටයුතු සිදු කරන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ජී.එච්.ජී. නීටා මහත්මිය විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

- 2022.04.01 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.
  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.04.01 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.04.01 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- 2022.04.01 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

**(ඌ) වෙනත් කරුණු**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, එල්.එච්. කුමුදු සුජීව මහතාගේ අදහස් දැක්වීම</u>**

රටේ ජනතාව මේ දිනවල උද්ඝෝෂණ සඳහා සම්බන්ධ වනුයේ ඔවුන්ට සිදු කිරීමට වැඩ නොමැතිව නොවන බවත්, ජීවත් විය නොහැකි වටපිටාවක් මේ වන විට සකස් වී ඇති බැවින්, ජනතාව මෙලෙස සාමකාමී උද්ඝෝෂණ කටයුතු සිදු කරනු ලබන බවත්, එහිදී පොදු දේපළ විනාශ කිරීමක්, මිනිස් ජීවිතවලට හානි කිරීමක් කිසිදු විටෙක සිදු නොකරනු ලබන බවත් වගකීමෙන් යුතුව ප්‍රකාශ කරන බව පවසන ලදී. උද්ඝෝෂණ සිදු කිරීමේ දී යම් යම් ගැටළු පැන නැගුණද, පක්ෂයක් ලෙස අප ඒ සඳහා පෙනී සිට ගැටළු ඇති නොවීමට වග බලා ගන්නා ලදී.

1987 වර්ෂයේ අසංවිධානාත්මකව සිදු කරන ලද කැරැලිවලදී ද මා පෙනී සිට බේරා ගැනීම් ආදී කටයුතු සිදු කරන ලදී. 1987 ඉන්දු ලංකා සාම ගිවිසුම අත්සන් කිරීමේ දී රටේ ජනතාව උද්ඝෝෂණ සංවිධානය කළ අවස්ථාවන්හිදී ද ජනතාවගේ ජීවිත බේරා ගැනීම සඳහා අප දේශපාලන නායකයින් මැදිහත් වී කටයුතු කරන ලදී. ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම සිදු කරන ලද්දේ එක් පුද්ගලයෙකු වෙනුවට එකී නම යොදා ගනිමින් පුද්ගලයින් දහසක් පමණ මරා දැමීමට කටයුතු සිදු වූ නිසාවෙන්ය. එදා සිදු කරන ලද සටන සේම අදටත් ජනතාව වෙනුවෙන් අප සටන් වදිනු ඇත. පොහොර, ගෑස්, ඉන්ධන, කිරි පිටි ආදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ජනතාවට මුදලට හෝ ලබා ගැනීමට නොහැකි වීම මත මෙසේ උද්ඝෝෂණ සංවිධානය කිරීමට හේතු පාදක වී ඇත. අප දේශපාලන පක්ෂයක් වශයෙන් විවිධ මතවාද, මත ගැටුම් තිබුණද, අප රටේ ජනතාව වෙනුවෙන් පෙනී සිට කටයුතු කරනවා මිසක, කිසි දිනක ප්‍රචණ්ඩකාරී ක්‍රියා කිරීමට කටයුතු නොකරන බව වගකීමෙන් යුතුව ප්‍රකාශ කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මේ දිනවල රටේ මතු වී ඇති ආර්ථික තත්ත්වය හමුවේ දේශපාලන පක්ෂ ආරක්ෂා කර ගැනීමට වඩා, රටේ ජනතාව වෙනුවෙන් කටයුතු කිරීමට අප සියලුම දෙනා එකට එක්ව කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම</u>

පුංචි ආණ්ඩුවේ ගරු සභිකයින් 23 දෙනාට මෙන්ම සමස්ත ජනතාවටම දැනෙන ප්‍රශ්නයක් අද වන විට රටේ උද්ගත වී ඇති බවත්, රටේ ආර්ථික අර්බුධය මුළු ලංකාවටම බලපා ඇති කරුණක් වී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

1977 වර්ෂයට පෙර සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුව කාලයේ ද ජනතාවට ගොඩාක් දුක් විදීමට සිදු විය. බඩු ලබා ගැනීම සදහා පෝලිම් වල සිටීමට සිදු වුවත්, සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය එම කාලය තුළ රටට බොහෝ දේ අයිති කර ගැනීම අදී කටයුතු සිදු කරන ලදී. නමුත් මිනිසුන්ට අවශ්‍ය කරන මුලික අවශ්‍යතාවයන් අඩු වීම නිසා, එවක පාර්ලිමේන්තුව ආසන 08 ට බැස යාමක් ද සිදු විය. පසුව 1977 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පත් වූ පසුව, 1982 වන විට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ජනාධිපති වී විශාල බලයක් ලබා ගැනීමට හැකි විය. එම කාලය තුළ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව විසින් මහවැලි ව්‍යාපාරය, වික්ටෝරියා, රන්දෙණිගල අදී ව්‍යාපාර නිදහස් වෙනළද කලාපය, විශ්ව විද්‍යාල ආදිය ඇති කරලීමට කටයුතු කරන ලදී. එසේම ඉන් අනතුරුව පැමිණි චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිණියගේ කාලය තුළ ලංකාවේ ජනතාවට ලොකු සේවාවන් රැසක් සිදු විය. ඉන් පසුව පැමිණි මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ පාලන කාලය තුළ පාර්ලිමේන්තුවේ සිටින දේශපාලන නායකයින් බොහෝ සෙයින් සිදු කරන ලද්දේ තම තත්ත්වය බලය රැක ගැනීමට කටයුතු කිරීමයි. අද වන විට සිටින තරුණ පිරිස දැඩි අවේගශීලිය. එම නිසා උද්ඝෝෂණ වැඩි වී ඇත. මේ වන විට පාසල්වල දරුවන්ට ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම සදහා අවශ්‍ය කඩදාසි නොමැති වී ඇත. විදුලිය නොමැත. බඩු මිල අධික ලෙස ඉහල ගොස් ඇත. මෙකී තත්ත්වයන් නිසා ජනතාව දැඩි අර්බුධකාරී තත්ත්වයක සිටී. මෙකී අවශ්‍යතාවයන් ජනතාවට අවංකවම හදට දැනෙන ගැටළුය. මෙකී ගැටළුකාරී තත්ත්වයන් මතු වීම නිසා ජනතාව උද්ඝෝෂණ සිදු කරනු ලබයි. යම් අවස්ථාවකදී දැඩි අවේගයක් වුවහොත්, එහි ලොකු විනාශයක් සිදු වනු ඇත. එම නිසා කරනු ලබන උද්ඝෝෂණ ගැටළුකාරී තත්ත්වයන් ඇති නොකර, නිහඩව සිදු කිරීම වඩාත් සුදුසු වනු ඇත.

පාර්ලිමේන්තුවේ අමාත්‍ය මණ්ඩලය මාරු වී හෝ රටේ ජනතාවට හොද ආර්ථික තත්ත්වයක් ලබා ගත හැකි වටපිටාවක් සකස් කර දිය යුතුය. තිස්සමහාරාමය ගත් කළ අපගේ පුංචි ආණ්ඩුවේ පක්ෂය සියල්ලම එකට එකතු වී සිදු කරන ලද සේවාව පිළිබද සතුටු වන බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, වැල්ලගේ ජීවානි මහත්මියගේ අදහස් දැක්වීම</u>

මේ දිනවල රටේ ජනතාව ලොකු පීඩනයකට පත්ව සිටී. එසේ සිටින අවස්ථාවක කාන්තාවකට රන් භාණ්ඩයක් එළදාගෙන යා නොහැකි තත්ත්වයකට සොරුන් බිහි වී ඇත. මෙකී සොරකම් වැඩි වශයෙන් සිදු වන්නේ කාන්තාවන් වෙතය. රටේ ආර්ථික තත්ත්වය බිද වැටීමත් සමඟ මිනිසුන් ළඟ තිබෙන සාරධර්ම නැති වී ගොස් ඇත. මෙකී සොරකම් වැඩි වශයෙන් සිදු වන්නේ එදාවේල කෑමට දෙයක් සොයා ගැනීමට වත්කමක් නොමැති අය වෙතින්ය. එම නිසා රටේ ආර්ථික තත්ත්වයේ බිද වැටීම මේ සදහා බලපා ඇති බව කිව හැකිය.

පාසල්වල පලමු වාරය අවසන් වීමට ආසන්නව තිබියදී අධ්‍යාපන ලේකම් විසින් චක්‍රලේඛයක් නිකුත් කර පාසල් නිවාඩු ලබා දීම ගුරුවරුන්ට මෙන්ම පාසල් දරුවන්ට වකිතයක් වී ඇත. 2021

වර්ෂයේ අවසන් වාරයේ අවසන් කිරීමට තිබූ වැඩ බොහොමයක් මෙසේ අත්තනෝමතික තීන්දු තීරණ ගැනීම නිසා සිදු කිරීමට නොහැකි විය.

එසේම 2020 / 2021 වර්ෂවල අධ්‍යාපන කටයුතු සිදු කර ගෙන යාමට සිදු වූයේ ඉතාමත් මන්දගාමී විදියටයි. එම වර්ෂ තුළ බාහිර කටයුතු කිසිවක් කිරීමට නොහැකි විය. එම නිසා මෙම වසර තුළ දරුවන්ගේ මනස අලුත් කිරීම සඳහා අවුරුදු උත්සවයක් සංවිධානය කර, ඒ සඳහා ආර්ථික අඟහිඟකම් මැද වුවත් දෙමාපියන්ද දරුවන් සතුටු කිරීම සඳහා අවශ්‍ය රෙදි මසා ඒ සඳහා සූදානමින් සිටියද, අධ්‍යාපන ලේකම් විසින් ක්ෂණිකව පාසල් නිවාඩු ලබා දී, සිදු කරන ලද අත්තනෝමතික ක්‍රියාව නිසා එම උත්සවය සිදු කිරීමට නොහැකි වීම සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ උද්ඝෝෂණ කටයුතු ලංකා ගුරු සංගමය, කලාකරුවන් විසින් ද සිදු කරන ලදී. එසේ ගත් කළ රට තුළ මේ දිනවල සිදු කරන ලද උද්ඝෝෂණ කටයුතු පාට පක්ෂ භේදයක් නොසලකා සිදු කරන බවත්, මෙකී කටයුතු ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය පමණක් සිදු කරන දෙයක් නොවන බවත් ප්‍රකාශ කරන ලදී. එසේම රටේ ජනතාවට දැනෙන වේදනාව, පීඩනය නිසා මෙවැනි උද්ඝෝෂණ සිදු කිරීම රටේ ජනතාව විසින් සිදු කරනු ලබන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මියගේ අදහස් දැක්වීම**

අද දින අප රට තුළ කණගාටුදායක තත්ත්වයකට පත්ව ඇත. පසුගිය ආණ්ඩුවල සහ මෙම ආණ්ඩුවේ ගන්නා ලද වැරදි තීරණ නිසා රටට අද මෙවැනි තත්ත්වයක් උදා වී ඇත. අධ්‍යාපන, සෞඛ්‍ය ගැටළු සේම ගෑස්, ඉන්ධන, කිරි පිටි සහ බඩු මිල ඉහල යාම සහ නීතිය සම සේ ක්‍රියාත්මක නොවීම, ආරක්ෂාව වැනි මූලික අයිතිවාසිකම් ගිලිහී යාමත් සමඟ ජනතාව දැඩි ආවේගශීලී තත්ත්වයක් උදා වී ඇත. ආණ්ඩුවේ 225 දෙනා ප්‍රතික්ෂේප කරනවා සේම, ගම්වල ජනතාවගේ හිත්වල අප පිළිබඳව ද කිසිදු ප්‍රසාදයක් නොමැත. මෙකී තත්ත්වය බොහෝ සෙයින්ම දැනෙන්නේ කාන්තාවන් හටය. මහජන නියෝජිතයින් ලෙස ජනතාව පත්ව ඇති මෙකී තත්ත්වයන් සඳහා යම් දෙයක් කිරීමට හැකි නම්, එය ජනතාවට ලබා දිය හැකි සහනයක් වනු ඇත.

රට තුළ ප්‍රශ්නයක් උද්ගත වී ඇති අවස්ථාවේ ජනතාව විසින් උද්ඝෝෂණ සිදු කරනු ලබන්නේ කිසිදු පාට පක්ෂ භේදයක් නොසලකාය. සියලුම ජනතාව එක්ව එලෙස සිදු කරන්නේ තම අවශ්‍යතාවයන්, අයිතිවාසිකම් දිනා ගැනීම සඳහාය. එම නිසා මහජන නියෝජිතයින් ලෙස අප සියලුම දෙනා එකට එක්ව ජනතාවට යම් සහනයක් ලබා දීමට නිවැරදි තීරණ ලබා ගෙන, එකී තීරණ පාර්ලිමේන්තුව වෙත යොමු කරවීමට කටයුතු කළ හැකි නම් එය වඩාත් යෝග්‍ය වන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ජී.එච්.ජී. නීටා මහත්මියගේ අදහස් දැක්වීම**

ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභික මහත්ම මහත්මීන්ටත්, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් සුභම සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

තම සහෝදරියගේ ස්වාමිපුරුෂයාගේ අවමංගල්‍ය උත්සවයේ අවශ්‍යතාවයන් පිළිබඳව සොයා බැලීම් සිදු කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන අතර, අවමංගල්‍ය උත්සවය සඳහා පැමිණි ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාට ස්තුතිය පුද කරන ලදී.

එසේම අවමංගල්‍ය උත්සවය සඳහා පැමිණි පිරිසට ආහාරපාන සැපයීම සඳහා ගෑස් නොමැතිවීම හේතුවෙන් එම පැමිණි පිරිසට හෝටලයකින් ආහාරපාන ගෙන්වා දීමට සිදු විය. එම

අවස්ථාවේ අප පවුලේ සියලුම දෙනා දැඩි අසරණභාවයකට පත්වීමට සිදු විය. රටේ ගෑස් ලබා ගැනීමට නොමැති වීම පිලිබඳ මා අදටත් කණගාටුවන බව ප්‍රකාශ කරන ලදී.

සිංහල අලුත් අවුරුද්දක් පැමිණියද ජනතාවට ඒ සඳහා සූදානම් වීමට නොහැකි තරමට බඩු මිල ඉහල ගොස් ඇත. පාරිභෝගික අධිකාරිය විසින්, මිල නියමයක් නොකිරීම මත, එක් එක් වෙළඳසැල්වල බඩු විවිධ විවිධ මිල ගණන් යටතේ අලෙවි කරනු ලබයි. මේ හේතුව නිසාම ජනතාව දැඩි අසරණභාවයට පත්වී සිටී. එම නිසා මෙවැනි වෙළඳසැල් සම්බන්ධයෙන් සොයා බැලීම් කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමා යනු දරුවන් හට අසීමිත ලෙස ආදරය කරන පියෙකි. එතුමාගේ පුතණුවන් රෝගාතුර වූ අවස්ථාවේ දරුවා සුව කර ගැනීම සඳහා අප සියලුම දෙනාද බෝධි පූජා සිදු කරන ලදී. නමුත් අද වන විට රට තුළ රෝගීන් සඳහා ලබා දීමට බෙහෙත් පවා නොමැති තත්ත්වයක් මත රෝගීන් දැඩි අසරණභාවයකට පත්ව ඇත. එම රෝගී ජනතාවට අවශ්‍ය කරන බෙහෙත් ලබා දී, ජීවිත බේරා ගැනීමට රජය විසින් කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

රටේ ජනතාවට දැවෙන ප්‍රශ්න බොහොමයක් තිබෙනු ඇත. අප මහා සභාවට පැමිණ ඒ සම්බන්ධයෙන් අදහස් දක්වනුයේ ගරු සභාපතිතුමා විසින් එකී කරුණු ඉහල තලයේ දේශපාලන නායකයින් වෙත දන්වා, විසඳුම් ලබා ගැනීමටත්, ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීමටත් කටයුතු කිරීම වෙනුවෙන්ය. එම නිසා මෙකී කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම</u>

රටේ පවතින තත්ත්වයන් නිසා ආර්ථික අර්බුධකාරී තත්ත්වයන් මතුව ඇත. ඇතැම් පක්ෂ මෙකී ප්‍රශ්න මුලට ගෙන, පක්ෂවල උන්නතිය වෙනුවෙන් කටයුතු කරන අවස්ථාවන් ද දැක ගැනීමට ඇත. රටේ ජනතාවට දැවෙන ප්‍රශ්නයන් මතුව ඇති නිසා ජනතාව උද්ඝෝෂණ කටයුතු සිදු කරයි. එසේ සිදු කිරීමේ දී දේශපාලන අරගලයන් ඇති කර නොගෙන, රටේ සේම තිස්සමහාරාමයේ ජනතාව වෙනුවෙන් අප සියලුම දෙනා එකට එක්ව කටයුතු කළ යුතුය. එසේම මෙකී අරගල සිදු කිරීමේ දී වෙනත් අංශ වෙතින් එමගින් ප්‍රයෝජන ලබා ගන්නා අවස්ථාවන් ද බොහොමයක් පවතිනු ඇත.

ලංකාවේ දක්ෂ ආර්ථික විද්‍යාඥයන් බොහොමයක් සිටී. ඔවුන් ප්‍රකාශ කරන්නේ ඔවුන් වෙත වසරක් හෝ රට පාලනය කිරීමට ලබා දෙන්නේ නම්, සැලසුම් සහගතව මෙකී ප්‍රශ්න විසඳා ගනිමින් රට ගොඩ නගා දීමට කටයුතු කළ හැකි බවයි. එලෙස ආර්ථික විද්‍යාඥයින් විසින් ප්‍රකාශ කරන්නේ නම්, හසල දැනුමත් ඇති එම විද්‍යාඥයින් වෙත රටේ වගකීම භාර දී රට ගොඩනැගීමට දායකත්වය ලබා ගත හැකි බව ප්‍රකාශ කරන ලදී.

අප සභාවේ මහජන නියෝජිතයින් 23 දෙනාම තම පක්ෂ ආරක්ෂා කර ගැනීම සිදු නොකර, ජනතාව ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. රට තුළ මෙවැනි අර්බුධකාරී තත්ත්වයන් ඇති වන්නේ පාර්ලිමේන්තුවේ 225 ම සිදු කරන ලද වැරදි ක්‍රියා හේතුවෙන්ය. දේශපාලනය පිළිබඳ කතා කිරීමත් ප්‍රිය ජනක නොවන කරුණක් වී ඇත. රටට මෙලෙස බලපෑමක් එල්ල වන්නේ දේශපාලනය සඳහා සුදුසු පුද්ගලයින් පත් කර නොගැනීම නිසා බව කිව හැකිය.

රට තුළ පවතින ගැටළුකාරී තත්ත්වයන් සඳහා අප විරෝධය පල කරනවා මිසක ගරු සභාපතිතුමා වෙත කරන ලද විරෝධයක් නොවන බව සඳහන් කළ යුතුය. ගරු සභාපතිතුමා යනු තිස්සමහාරාමයට ලැබුණු හොඳ නායකයෙක් සේම උතුම් මිනිසකි. එම නිසා අප රටේ සියලුම ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා මෙකී ඇති වී ඇති ගැටළුකාරී තත්ත්වයන් හට විසඳුම් ලබා දීම සඳහා

ජනතාව මුහුණ පා තිබෙන ගැටළු සම්බන්ධයෙන් දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ අදහස් දැක්වීම</u>**

මේ දිනවල රට තුළ පවතින අරගලය සේම, 1989 වර්ෂයේ දී ඇති වූ අරගලයකින් මිනිස් ජීවිත සඳහා අනතුරු සිදු වූ අවස්ථාවන් තිබුණි. මේ දිනවල ජනතාවට දැවෙන ප්‍රශ්න හේතුවෙන් උද්ඝෝෂණ රැළි සිදු කළද, ඒ සඳහා අතරමැදියන් මැදිහත් වී ලොකු අර්බුධකාරී තත්ත්යන් ඇති කරන අවස්ථාවන් ද දැක ගන්නට තිබේ.

ඉදිරි අවුරුදු සතිය තුළ සතොස මගින් ජනතාවට සහනදායක මිලකට නිවසට අවශ්‍ය බඩු ලබා ගැනීමට හැකි වන පරිදි වැඩපිළිවෙලක් සකස් කර දීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

තම කොට්ඨාසයේ අබලන් තත්ත්වයේ පවතින මාර්ග මෝටර් ග්‍රේඩර් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

වන අලි ප්‍රශ්නය විසඳාලීම සඳහා සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සිදු කළද, එය පැවැත්වීමට නොහැකි විය. නව විදුලි වැට ගැසීම සම්බන්ධයෙන් ජනතාව දැඩි සේ විරුද්ධය. එය එසේ සිදු වන්නේ රණකෙළිය, විහාරමහාදේවීපුර ප්‍රදේයන්හි බොහෝ ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් නිසාය. එම නිසා වනජීව සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව ගෙන්වා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමටත්, එම සාකච්ඡාව හරහා යෝජිත විදුලි වැට සකස් කර දෙන ලෙසටත් ඉල්ලීම් කිරීම සුදුසු වන බවත් ප්‍රකාශ කරන ලදී.

ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද තිස්සමහාරාම ජනතාවට සේම රටවාසී සියලුම ජනතාවට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>**

රට තුළ උද්ගත වී ඇති වර්තමාන තත්ත්වය පිළිබඳ අද දින සියලුම දෙනා අදහස් දක්වන ලදී. අප මහජන නියෝජිතයින් ලෙස පත් වූ පසුව අප හට ගෞරවයක් සහ ගාම්භීරත්වය ජනතාවගෙන් ලැබෙන ලදී. එසේ ජනතාව ලබා දුන් ගෞරවයට ඔවුන් සඳහා සේවයක් කිරීමට තිබූ කාලය තුළ සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය, කොරෝනා වසංගත තත්ත්වය, මේ වන විට උද්ගත වී ඇති ආර්ථික තත්ත්වය ආදී ව්‍යවසනවලට මුහුණ දීමට සිදු වූ නිසා ජනතාවට වැඩි සේවාවක් ඉටු කිරීමට නොහැකි විය. රටේ පවතින තත්ත්වය සමඟ අපෙන් ජනතාවට ලබා දිය යුතු සේවාවන්, සංවර්ධන කටයුතු සිතූ අයුරින් ඉටු කර දීමට නොහැකි වීම සම්බන්ධයෙන් තම කණගාටුව ප්‍රකාශ කරන බව දන්වා සිටින ලදී.

1988-1989 වර්ෂවල ඇති වූ භීෂණ තත්ත්වයන් සමඟ තම පියා දේශපාලනය සිදු කළ නිසා එක් එක් තර්ජන, කරදරකාරී තත්ත්වයන් රැසකට මුහුණ දුන් කුඩා අවදියක් අප හට තිබුණි. අප කුඩා කාලයේ මෙකී භීෂණ තත්ත්වයන් නිසා මිනිසුන් අමු අමුවේ පිලිස්සීමේ සිදුවීම් ද තම ඇස් දෙකට දැක ගැනීමට සිදු විය. එකී භීෂණ තත්ත්වයන් පිළිබඳ කතා කිරීමේ දී අදටත් එවැනිම තත්ත්වයකට අපට මුහුණ පෑමට සිදුවනු ඇතැයි සඳහන් කළ යුතුය.

රට තුළ පවතින මෙම අර්බුධකාරී තත්ත්වයන් හමුවේ සෑම රාජ්‍ය ආයතනයකම, පෞද්ගලික ආයතනයකම දේශපාලනය පිළිබඳ කතා බහා කරනු මිසක, ආයතනයන්හි සේවාවන් සිදු කිරීම මන්දගාමී වී ඇති බව පෙනී යනු ඇත. රට තුළට වර්තමානයේ උද්ගත වී ඇති සියලුම ප්‍රශ්න වර්තමාන

ආණ්ඩුව පැමිණි පසුව සිදු වූ සිදුවීම් නොවන බවත්, මෙකී සිදුවීම් සියල්ලටම මීට පෙර පාලන කළ සියලුම ආණ්ඩු වගකිව යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

යම් ආයතනයක ප්‍රධානියෙක් ගත් කළ ඔහු සිටින දේශපාලන පක්ෂයට අනුව ආයතනයේ වැඩ කටයුතු සියල්ල සිදු වේ. එසේම පාසල්, රෝහල්, උපකාරක පන්ති ආදි ආයතනවලත් සිදු කරන ලද සේවාවන් දේශපාලනීකරණය වී ඇත. මෙම ක්‍රමය නවතා දමා රට ගොඩනැගීමට නම් ආයතනවල දේශපාලනීකරණය නැති කර දමා විධිමත්ව එකී කටයුතු සිදු කළ යුතුය.

සමාජ මාධ්‍ය ජාලා ගත් කළ දේශපාලන පක්ෂ වශයෙන් විවිධ මඩගැසීම් සිදු කරනු ලබයි. නිවැරදි පුවත් වුවත් වැරදි ආකාරයෙන් පල කරනු ලබයි. මෙකී මඩ ගැසීම් එක් එක් පක්ෂවල පුද්ගලයින් විසින් සිදු කරනු ලබයි. මෙකී තත්ත්වයන් වළකාලීමට නම් දේශපාලනය කළ යුතු අය දේශපාලනය කළ යුතු සේම, රැකියා සිදු කරන අය රැකියාවල කටයුතු කළ යුතුය. රැකියාවල නියුතුවන් දේශපාලන කිරීමට යාම නිසා ගැටුම් වැඩි වහයෙන් ඇති වීමට හේතු වී ඇති බව කිව හැකිය.

ලබන්නා වූ නව වසර ජනතාවට සුභ පැතිය නොහැකි වුවත්, රට යථා තත්ත්වයට පත් කර ගත හැකි සුභ නව වසරක් වේවායි කියා සියලුම රටවාසී ජනතාවට ප්‍රාර්ථනා කරන ලදී.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතාගේ අදහස් දැක්වීම**</u>

රටක් ලෙස මේ වන විට අර්බුධකාරී තත්ත්වයකට රට පත්ව ඇත. අලුත් අවුරුද්ද පැමිණියත් නිවසට අවශ්‍ය බඩු ලබා ගැනීමට නොහැකි ලෙසට ආර්ථිකය බිඳ වැටී ඇත. ජනතාව දැඩි ලෙස පීඩනයකට ලක් වී සිටී. අලුත් අවුරුද්දට සුභ පැතුම් එක් කළ නොහැකි වුවත්, සියලුම දෙනා එකට එක්ව යහපත් රටක් ගොඩ නැගීමට ඉදිරියේ සියලුම පුද්ගලයින්ට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

මේ වන විට වී අස්වනු නෙලීම ආරම්භ වී ඇත. වී වගාව ආරම්භයේ ඒ සඳහා අවශ්‍ය කරන පොහොර නොමැතිකම නිසා දැඩි අසීරුතාවයකට පත් වී කුඹුරු වගාව සිදු කළත්, එසේ සිදු කරන ලද වී වගාවේ තිබෙන අස්වනු නෙලා ගැනීමට ඉන්ධන නොමැතිකම නිසා ගොවි ජනතාව දැඩි ගැටළුකාරී තත්ත්වයකට පත්ව සිටී. එසේම ඊළඟ කන්නයේ වී වගාව ආරම්භ කළ යුතු වුවත් වල් මර්ධනය සඳහා අවශ්‍ය කරන තණ කොළ තෙල් නොමැතිකම නිසා වගාවන් සිදු කළ නොහැකි තත්ත්වයකට පත්ව ඇත. ගිය කන්නය තුල ඇතැම් වෙළඳසැල්වල රු. 20,000.00 පොහොර තිබුණද, එය මෙම කන්නය වන විට රු. 40,000.00 දක්වා ඉහල ගොස් ඇත. තවද, වී වගාව සඳහා ලබා දෙන පොහොර සහනාධාර මුදල් ලබා දෙන්නේ කෙසේද, අක්කරයක් සඳහා කොපමණ සහනාධාර මුදල් ප්‍රමාණයක් ලබා දෙන්නේ ද යන්නත් ගොවි ජනතාව මතු කරන කරුණුය. එම නිසා ගොවි ජනතාවට මතුව ඇති මෙකී ගැටළු සඳහා දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා කර විසඳුම් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

රටේ ජනතාවට ඉන්ධන, ගෑස්, කිරිපිටි ආදීය ලබා ගැනීම සඳහා පෝලිම්වල සිටියද, ඒවා ලබා ගැනීමට නොහැකි වූ පසුව, ඔවුන් දැඩි විරෝධයක් දක්වනු ලබයි. මෙකී අවශ්‍යතාවයන් ජනතාවට අවශ්‍යකරනම දේවල් වන නිසාත්, ජනතාවට එවැනි දේ ලබා ගැනීමට නොහැකිව එකී සෑම දෙයක්ම දේශපාලන නායකයින්ට තිබියදී රටේ සියලුම ජනතාව වෛරයෙන් යුතුව කටයුතු කිරීම වැරදි සහගත නොවන බව සඳහන් කරන ලදී.

රට තුළ පවතින අර්බුදය හමුවේ ආණ්ඩුව භාර ගැනීමට කිසිවකුත් ඉදිරිපත් නොවන්නේ ආණ්ඩු අභ්‍යන්තරයේ ගැටළුකාරී තත්ත්වයන් පවතින නිසාය. රටේ පාලනය භාර දීම සඳහා නිවැරදි පාලනයක් ජනතාව විසින්ම තෝරා පත් කර ගැනීමට ඔවුන්ට අවස්ථාව ලබා දිය යුතුය.

අප සභාවේ ගරු සභිකයින් 23 දෙනාම එකට එක්ව ජනතාව වෙනුවෙන් සේවය කළද, පාර්ලිමේන්තුවේ සිටින දේශපාලන නායකයින් 225 දෙනා එසේ කටයුතු නොකරනු ඇත. යම් නිවැරදි තීරණයක් ලබා ගැනීමේ දී, ඒ සඳහා විරුද්ධ වීමට කටයුතු කරයි. එය එසේ සිදු කරන්නේ ඇතැම් නායකයින්ගේ බලය, ව්‍යාපාර ආරක්ෂා කර ගැනීමට බව කිව හැකිය. යම් දිනක අප පාලනයක් පත් වුවහොත් පාර්ලිමේන්තු දේශපාලන නියෝජිතයින්ගේ වාහන බලපත්‍රය, විශ්‍රාම වැටුප අහෝසි කිරීමටත්, සොරකම් සිදු කිරීම ආදී කටයුතු අනිවාරයෙන්ම නතර කිරීමට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.

අප සියලුම දෙනාට දැවෙන ප්‍රශ්න හමුවේ විරෝධතා සිදු කළත්, අප පොදු දේපළ විනාශ කිරීම්, ජීවිත අනතුරු සිදු කිරීම්, ප්‍රචණ්ඩ ක්‍රියා ඇති කර ගැනීම්, ගැටුම් ඇති කර ගැනීම් කිසිවක් සිදු නොකරනු ඇත. පීඩාකාරී ප්‍රචණ්ඩත්වයෙන් තොර දේශපාලනයක් අප සතුව පවතින බව ප්‍රකාශ කරන ලදී.

එසේම, රට තුළ මේ වන විට උද්ගත වී ඇති ප්‍රශ්න සඳහා කඩිනමින් විසඳුම් ලබා ගනිමින්, නිවැරදිව සැලසුම් සහගතව රට පාලනය කළ හැකි හොඳ පාලනයක් ඉදිරියේ ලබා ගත හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම**

රට තුළ පැන නඟින ගැටළු ඇති වීමට පෙර සාකච්ඡා කර ඒ සඳහා යම් තීරණයක් ලබා ගත්තේ නම්, අද අප රටට මෙවැනි අර්බුදකාරී තත්ත්වය මතු නොවනු ඇත. මෙකී තත්ත්වයන් හමුවේ ජනතාව දැඩි පීඩනයකට සහ අසරණභාවයකට පත්ව සිටින බව ප්‍රකාශ කරන ලදී.

සභාවේ පවතින ආර්ථික තත්ත්වය පහල බැසීම මත, සභාවට ගනු ලබන මිලි ලීටර් 500 කුඩා ජල බෝතල් ඉදිරියේ දී ලබා නොගැනීමට තීරණය කිරීම හොඳ දෙයකි. මීට පෙර බස්නාහිර පළාතේ බෝතල් ලක්ෂ 05 කට වැඩි ප්‍රමාණයක් මුහුදට මුදා හැරීම නිසා එමගින් පරිසරයට සිදු වන දැඩි හානිය පිළිබඳ පුවත්පතක, පල කර තිබුණි. එම පුවත දුටු දින සිට මා ප්‍රතිපත්තියක් ලෙස සභාවෙන් ලබා දෙන ජල බෝතලය ලබා නොගැනීමට කටයුතු කළ බවත්, මා එසේ සිදු කරනවා සේම සභාවේ සියලුම දෙනාද එසේ සිදු කරන්නේ නම් ජල බෝතල් සඳහා යන වියදම අඩු කර ගැනීමට හැකිය. එලෙස රටේ සියලුම ජනතාව සිතන්නේ නම් රටට යහපත් තත්වයක් ගෙන යා හැකි බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභිකයින් 23 දෙනාගේම ඒකමතික තීරණයක් වුයේ තිබෙන විදුලි වැට ගැසීමයි. ඒ සම්බන්ධයෙන් අප සියලුම දෙනා එක්ව ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කිරීමට යොදා ගත්තද, ඒ සඳහා සම්බන්ධ වුයේ තමා පමණකි. එය එසේ සිදු වීම සම්බන්ධයෙන් මාගේ කණගාටුව ප්‍රකාශ කරන බව දන්වා සිටින ලදී.

උද්ධකන්දර ප්‍රදේශයේ අක්කර 500 ක පමණ භූමි ප්‍රමාණයක් පොලිස් විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව ඇතිව ග්‍රාම නිලධාරී සහ රජයේ මිණින්දෝරු නිලධාරීන් විසින් මැනුම් කටයුතු කරන ලදී. එම අක්කර 500 භූමි ප්‍රමාණය මිල්ලත්ත හන්දියේ සිට විල්බට් මහතාගේ නිවස දක්වා සහ අනෙක් පසෙකින් ජපන් පාරේ සිට තඹරව හන්දිය දක්වා වන අතර, එකී භූමි ප්‍රමාණයන් නිදහස් කර, විශ්ව විද්‍යාලයක් සඳහා අක්කර 200 සහ විශේෂ කාර්ය බලකායට අක්කර 100, සෝලා පැනල් ආයතනයකට අක්කර 30 ක් සහ අනෙක් ඉතිරි භූමි ප්‍රමාණයන් තරුණ ව්‍යවසායකයින්ට ලබා දීමට තීරණය කර ඇත. තරුණ ව්‍යවසායකයින් ලෙස ඉඩම් ලබා දීම සඳහා පිරිසක් තෝරා ගෙන තිබුණද, ඒ සඳහා ද තෝරා ගෙන ඇත්තේ ව්‍යාපාරික කටයුතු සිදු කරන පුද්ගලයන්ගේම දරුවන් බව සඳහන් කරන ලදී. උද්ධකන්දර මෙකී අක්කර 500 දීර්ඝ කාලයක් තිස්සේ ගොවි ජනතාව වගාවන් සිදු කරන ලද භූමි ප්‍රමාණයන්ය. සෝලා පැනල් ව්‍යාපෘතිය හොඳ දෙයක් වුවද, මේ සඳහා දීර්ඝ කලක් තිස්සේ

වගාවන් සිදු කරන ලද ඉඩම් ලබා ගෙන, මෙකී ව්‍යාපෘති සිදු කරන්නේ නම්, එම වගාකරුවන් සඳහා 35% ක කොටසක් හෝ ලබා දිය යුතුය. තවද, මෙකී අක්කර 500 ක භූමි ප්‍රමාණය සඳහා නඩුවක් ද ගොණු කර තිබුණද, මෙකී ඉඩම් ලබා දෙන නිසාම රජයේ වාහනවලින් නිලධාරීන් ගොස් ඊට අදාළ කටයුතු ද සිදු කරනු ඇත. මෙකී භූමි ප්‍රමාණයන් ව්‍යවසායකයින්ට ලබා දීමට යෝජිත වුවත් එය සත්‍ය වශයෙන්ම තරුණ ව්‍යවසායකයින්ට ලබා දීමට කරුණු සිදු නොවන බවට කරුණු දැන ගැනීමට ලැබී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙසට ඉල්ලා සිටින ලදී.

තමා මීට පෙර පැවැති කෘෂි කමිටු සඳහා සහභාගී වී ඇත. පසුගිය දිනක කෘෂි කමිටුව සඳහා තමා සහභාගී වීම ප්‍රමාද වන නිසා, ගොවි සංවිධාන නිලධාරීන් එකී කමිටුව සඳහා සහභාගී වීමට ගිය පසුව ඔවුන් ඒ සඳහා සහභාගී කර නොගෙන ඇත. ගොවි ජනතාවගේ ප්‍රශ්න, ගැටළු සාකච්ඡා කර ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට හැකි වන්නේ මෙම කෘෂි කමිටුව සඳහා සහභාගී වූ පසුවයි. එම නිසා කෘෂිකමිටුව සඳහා අප ද සම්බන්ධ කර ගන්නා ලෙසට ප්‍රාදේශීය ලේකම්තුමිය වෙත දන්වා යැවීම සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

හෘද සාක්ෂිය අනුව කතා කිරීමේ දී  සෑම පක්ෂයකින්ම වැරදි සිදු වී ඇති වුවත්, ඒ සඳහා අවසානයේ වගකීමට සිදු වූයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙතය. වර්තමාන ආණ්ඩුව වෙත දෝෂාරෝපණ එල්ල කළද, අද වන විට රට තුළ උද්ගත වී තත්ත්වයන් සඳහා වර්තමාන ආණ්ඩුව පමණක් වගකිව යුතු නොවන බවත්, 1948 න් පසුව පාලනය කළ සියලුම ආණ්ඩු මේ සඳහා වගකිව යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ජනතාවට සහනදායි මුදලට සතොස හරහා බඩු ලබා ගැනීමට තිබුණද, අද වන විට සහනදායි මිලට සතොස හරහා වෙළඳසැල්වලින් බඩු ලබා ගෙන පසුව ඉතා අධික මුදලට අලෙවි කරනු ලබයි. මෙකී ජාවාරම් කටයුතු නතර කර දමා, අසරණ ජනතාවට සහනදායි මුදලට සතොස හරහා බඩු ලබා ගැනීමට හැකි වන පරිදි වැඩපිළිවෙලක් සකස් කර දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින අතර, සතොස හරහා සිදු කරනු ලබන ජාවාරම නවතා දැමීමට අප සභිකයින් 23 දෙනාම එකට එක්ව කටයුතු කළ යුතුය.

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ අදහස් දැක්වීම</u>

රටක් විදියට මේ අවස්ථාවේ ව්‍යවසනයකට මුහුණ දෙමින් සිටී. ජනතාවගේ මනාපෙන් තේරී පත්ව මහජන නියෝජිතයෙක් ලෙස පත් වුවද, රට තුල ඇති වූ ව්‍යවසන හමුවේ ජනතාවට වැඩි සේවාවක් ලබා දීමට නොහැකි විය. ආණ්ඩුව විසින් ගන්නා ලද යම් යම් තීන්දු තීරණ ක්‍රියාවට නැංවීමේදී සිදු වූ යම් යම් අඩුපාඩු හේතුවෙන් මෙකී තත්ත්වයන් මතු වන්නට හේතු වූ බව කිව හැකිය. අප රැස් වූ සෑම සාකච්ඡාවකදීම ප්‍රකාශ කරන ලද්දේ ගොවි ජනතාව සඳහා අවශ්‍ය කරන පොහොර ලබා දීමට කටයුතු කරන ලෙසයි. ගොවි ජනතාවට අවශ්‍ය කරන පොහොර ලබා දී ගොවි ජනතාව ශක්තිමත් කිරීමට හැකි වූයේ නම් අද මෙලෙස දැඩි අර්බුධකාරී තත්ත්වයක් ඇති නොවනු ඇත.

ගිය කන්නය සඳහා ඇතැම් ධනවත් පුද්ගලයින් ළඟ පොහොර තිබුණද, අසරණ ගොවි ජනතාවට පොහොර නොමැතිව කාබනික පොහොර පමණක් යොදා කුඹුරු වගාවන් සිදු කරන ලදී. ඊළඟ කන්නය සඳහා ද කුඹුරු වගා කිරීමට අවශ්‍ය කරන පොහොර ලබා දෙන බව ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කරන ලද ප්‍රකාශය විශ්වාසයේ තබා ගෙන ඉදිරියේ පොහොර ලබා ගැනීමට හැකි යැයි දැඩි බලාපොරොත්තුවෙන් යුතුව සිටින බව සඳහන් කරන ලදී.

රට තුළ මෙලෙස ඇති වූ ව්‍යවසන තත්ත්වයන් අප රට තුළ පමණක් නොව, ජාත්‍යන්තරයටම මුහුණ දීමට සිදු වූ ගැටළුවකි. සහරාන්ගේ බෝම්බ ප්‍රහාරයෙන් පසුව කොරෝනා වසංගතය රට පුරාම ව්‍යාප්ත වූ පසුව, රටේ ජනතාවගේ ජීවිත බේරා ගැනීම සඳහා විශාල ඩොලර් ප්‍රමාණයක් වෙන් කර, කොරෝනා එන්නත් ගෙන්වා ජනතාවට එන්නත් ලබා දීම නිසා රට තුළ මරණ සංඛ්‍යාව අඩු

කර ගැනීමට හැකි විය. මෙකී කරුණු ගත් කළ ගෙවී යන කාලය ඉතාමත් දුෂ්කර කාලයකි. ඒ සඳහා අප මුහුණ දිය යුතුය. රටට දුර්භික්ෂ, නියං තත්ත්වයන් ඉතිහාසයේ ද මතු වී රට කඩා වැටුනද, මෙකී තත්ත්වයන් අවම කර ගනිමින් රට නැවත ගොඩ නැගී ඇත. අද වන විට අප රට තුළ පවතින තත්ත්වයන් සඳහා ද විසඳුම් ලබා ගනිමින් රට යහපත් රටක් කර ගැනීමට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

පසුගිය දිනක තිස්සමහාරාමයේ සිදු කරන ලද උද්ඝෝෂණ රැල්ල සඳහා තරුණ පිරිස විශාල ප්‍රමාණයක් සම්බන්ධ වී සහාය ලබා දී ඇත. ජනතාවගේ දැවෙන ප්‍රශ්න සඳහා මෙලෙස උද්ඝෝෂණ සිදු කළද, යම් යම් කැරැළි, කණ්ඩායම් මේ සඳහා අනුබල දීමක් සිදු කර, දේශපාලන වාසි ලබා ගැනීමේ අරමුණු ඇතිව සම්බන්ධ වී කටයුතු කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ මතු වී ඇති අර්බුදකාරී තත්ත්වයන් නිමා වී ස්වයංපෝෂිත රටක් කර ගැනීමට සියලුම පාලකයන්ට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරන අතර, ඒ සඳහා අප සියලුම දෙනාගේ ද සහාය ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා පිළිබඳ අපගේ දැඩි විශ්වාසයක් පවතින බැවින්, ගරු එතුමන්ලා එකතු වී රට තුළ ඇති මෙකී අර්බුදකාරී තත්ත්වයන් අවම කර, රට ගොඩනැගීමට කටයුතු කරනු ඇතැයි විශ්වාස කරන බව ප්‍රකාශ කරන ලදී.

ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද සියලුම රටවාසී ජනතාවට සාමය සතුට පිරි සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථාන කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම</u>**

පාර්ලිමේන්තුව අප රටේ උත්තරීතරම සභාවයි. රට තුළ උද්ගත වී ඇති තත්ත්වය සඳහා විසඳුම් සෙවීමට පාට පක්ෂ භේද නොබලා, හිත් රිදවීම් සිදු නොකර ගනිමින් නිවැරදි තීන්දු තීරණ ලබා ගෙන කටයුතු කළ යුතුය. මාගේ දේශපාලන කාලය වසර 21 කි. එකී වසර 21 ක පුරාවටම කලු ඇඳුමින් සැරසී විරෝධයක් දැක්වූ පළමු අවස්ථාව අද වන බව සඳහන් කළ යුතුය. අද දිනත් කලු ඇඳුම් සැරසී දක්වන ලද විරෝධය ගරු සභාපතිතුමාට සිදු කරන ලද්දක් නොවන බවත්, රටේ ජනතාවට සේම අප හටද මේ වන විට දැනෙන ප්‍රශ්න නිසා සිදු කරන ලද්දක් බව ප්‍රකාශ කරන ලදී.

ඇතැම් දේශපාලන නායකයින් ප්‍රකාශ කරන වැරදි පුවත් නිසා ජනතාවගේ කෝපය තව තමත් වැඩි වනු ඇත. රටේ ඇති වී ඇති ප්‍රශ්න සඳහා යම් විසඳුමක් ලබා ගැනීමට පාර්ලිමේන්තුව රැස් වුවද, එහිදී ද සිදු වන්නේ මත ගැටුම්, ප්‍රශ්න හා ඔවුන්ගේ බලය රැක ගැනීම සඳහා පෙනී සිට කටයුතු කිරීම මිසක, ජනතාව වෙනුවෙන් තීන්දු තීරණයක් ගැනීමක් සිදු නොවේ. මෙකී තත්ත්වයන් අවම කර ගනිමින් පාර්ලිමේන්තුවේ නායකයින් 225 දෙනාම එකට එක්ව රටේ ඇති වී ඇති මෙම තත්ත්වයට විසඳුම් සෙවිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

රටේ ඉන්ධන, ගෑස්, කිරි පිටි නොමැති වීමත්, බඩු මිල ඉහල යාම සහ බොහෝ කාලයක් විදුලිය විසන්ධි කිරීමේ ගැටළුව නිසා ජනතාව දැඩි කෝපයකින් සහ පීඩනයකින් සිටී. එම හේතු නිසාම ජනතාව විරෝධතා ඇති කරලීමට කටයුතු කරනු ලබන බව ප්‍රකාශ කරන ලදී.

සිංහල අලුත් අවුරුද්ද පැමිණියද ජනතාවට ඒ සඳහා සූදානම් වීමට නොහැකි ලෙසට බඩු මිල ඉහල ගොස් ඇති බවත්, මේ වන විට වී මිලද යම් ඉහල යාමක් සිදු වී ඇති නිසා, හාල් මිල ද අධික ලෙස ඉහල යාමක්ද සිදු විය හැකි බවත්, එය එසේ සිදුවුවහොත් ජනතාව කෙතරම් අසරණභාවයකට පත් වනු ඇතැයි ද කණගාටුවෙන් වුවද සිහිපත් කරන ලදී.

සතොස හරහා ජනතාවට සහනාදායි මුදලට බඩු ලබා ගැනීමට හැකි වුවද, මේ වන විට සතොස ආයතනය පිළිබඳ කිසිදු විශ්වාසයක් ජනතාව සතුව නොමැත. මෙම ආයතනයෙන් ජනතාවට සහනදායි මිලට බඩු ලබා දීම වෙනුවට, වංචනික ලෙස වෙළඳැල් සඳහා විශාල වශයෙන් බඩු ලබා දීම් සිදු කරනු ඇත. මෙකී කරුණු ගත් කළ සතොස ආයතනය පිළිබඳ ඇති වන්නේ කලකිරීමකි. එම නිසා ජනතාව ගැන සිතා නැවත සමුපකාර සේවාව ආරම්භ කරන්නේ නම්, හදිසි අවස්ථාවකදී වුවත් සහන සැපයිය හැකි බවත්, එය ගුණාත්මකභාවයකින් යුතුව ආරම්භ කරන්නේ නම්, එය සාර්ථක වන බවත් ප්‍රකාශ කරන ලදී.

රටේ විශාල පිරිසක් ශල්‍යකර්ම සිදු කිරීමට සිටී. රට තුළ බෙහෙත් නොමැතිකම නිසා එම රෝගීන්ගේ ජීවිත දැඩි අවධානමක පවතී. එම නිසා අප රටේ මෙම ජනතාවගේ ජීවිත බේරා ගැනීම සඳහා අවශ්‍ය කරන බෙහෙත් ගෙන්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට දේශපාලන නායකයින් දැනුවත් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

රටට ලොකු ආදායමක් ලැබෙන සංචාරක ක්ෂේත්‍රයද මෙකී ගැටළුකාරී තත්ත්වයන් නිසා පහල බැස ඇත. අප රට තුළ තිබෙන ප්‍රශ්න ගැටළු හමුවේ විදෙස් රටවලින් ලංකාවේ සංචාරය නොකරන ලෙසට එම රටවල්වල ජනතාව දැනුවත් කර ඇත. මෙමගින්ද සිදු වන්නේ අප රටට ආදායම අහිමි වීමක් බව දන්වා සිටින ලදී.

මිල පාලනයක් නොමැතිකම නිසා, ප්‍රදේශයන්හි වෙළඳසැල් විවිධ විවිධ මිල ගණන් යටතේ භාණ්ඩ අලෙවි කරනු ලබයි. මෙකී තත්ත්වය නිසාද ජනතාව පත්ව ඇත්තේ දැඩි අසරණභාවයකටයි. එම නිසා මෙකී වෙළඳසැල් සම්බන්ධයෙන් සොයා බැලීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

රටේ ජනාධිපතිතුමා ජනතාව ගැන සිතා නිවැරදි තීන්දු තීරණ ලබා ගතහොත්, මුලු රටේම ජනතාවගේ ආශිර්වාදය එතුමන්ට ලැබෙන බව දන්වා සිටින ලදී.

රටටම ආදර්ශයක් දෙන තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදර්ශය ලබා ගෙන, රටේ පාලකයින් සියලුම දෙනා එක අරමුණක සිට කටයුතු කරන්නේ නම්, අප රට ගොඩනැගිය හැකි බව ප්‍රකාශ කරන ලදී.

කුමන ප්‍රශ්න, ගැටළු ඇතිවුවත් ලබන්නා වු සිංහල අලුත් අවුරුද්ද රටවාසි සියලුම ජනතාවට සමගිය සමාදානය පිරි, තුණුරුවන්ගේ ආශිර්වාදය ලැබෙන සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. චාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම**

අප ප්‍රදේශයේ ඉදි කිරීමට නියමිත යෝජිත විදුලි වැට ගොඩේ කලපුවේ සිට බන්දු වැව හරහා කරගම දෙසට ඉදි කිරීමට සැලසුම් කර තිබුණි. වනජීවි දෙපාර්තමේන්තුව එක්ව මීට බොහෝ කාලයකදී දැනට සිටින ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගරු වාරිමාර්ග අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා, වනජීවි අධ්‍යක්ෂකතුමා , දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් ගොස් විදුලි වැට ගැසීම සම්බන්ධව නිරීක්ෂණයක් සිදු කර විදුලි වැට ගැසීමට අදාළ කටයුතු සිදු වුවද, එය ක්‍රියාත්මක නොවීය. රට තුළ දැවෙන ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා සේම, දැඩි අර්බුදකාරී තත්ත්වයකි මෙම විදුලි වැට මේ වන තෙක්ම ඉදි කිරීමට කටයුතු නොකිරීම. විදුලි වැට ඉදි නොකිරීම නිසා ගොවි ජනතාවගේ වගාවන් සේම, ජීවිතද අනාරක්ෂිත තත්ත්වයක් පවතින බැවින්, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

වනජීවි දෙපාර්තමේන්තුව විසින් යෝජිත විදුලි වැට වෙනුවට අලුතින් විදුලි වැටක් සකස් කිරීමට සැලසුම් කරමින් සිටී. එලෙස නව විදුලි වැටක් සකස් කළහොත් දීර්ඝ කාලයක් තිස්සේ ස්ථිර වගාවන් සිදු කරන ලද ගොවි ජනතාවගේ ගොවි බිම් අහිමි වනු ඇත. එම නිසා යෝජිත විදුලි වැට

වෙනුවට නව විදුලි වැටක් ගැසීම සම්බන්ධයෙන් ජනතාවගේ විරෝධයක් මතුවන බැවින්, මෙම කරුණ සම්බන්ධයෙන් කඩිනමින් ගරු වනජීවී අමාත්‍යතුමා සහ වනජීවී අධ්‍යක්ෂකතුමා සමඟ සාකච්ඡාවක් ලබා දෙන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

අප රට වැවිලි ආර්ථිකයක් සහ කෘෂි ආර්ථිකයක් තිබෙන රටකි. එම නිසා අපගේ කෘෂිකර්මාන්තය රැක ගැනීම සඳහා ලබන කන්නයේ වී වගාව සිදු කිරීමට අවශ්‍ය කරන පොහොර ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසටත්, කුඹුරු වගාව ආරම්භ කිරීමේදී එකී වැඩ කටයුතු කිරීම සඳහා අවශ්‍ය කරන ඉන්ධන ලබා දීමට කටයුතු සිදු කරන ලෙසටත් ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා සමඟ සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

පසුගිය දිනක තමා මහා සභාවකදී කොම්පෝස්ට් පොහොර පමණක් යොදා වගාවන් සිදු කළ නොහැකි බවට අදහස් දක්වන ලදී. නමුත් කොම්පෝස්ට් පොහොර පමණක් යොදා වගාවන් සිදු කළ හැකි බවට තමා අදහස් දැක්වූ බවට වැරදි පුවතක් ගමේ ප්‍රචරය වී තිබේ. එහිදී තමා ප්‍රකාශ කරන ලද්දේ කාබනික පොහොර පමණක් යොදා වගාවන් සිදු කළ නොහැකි බවත්, ඒ සඳහා යූරියා හොන්ඩරයක් ද මිශ්‍ර කළ යුතු බවත් යනුවෙන් තමා මහා සභාවේ දී නිවැරදිව ප්‍රකාශ කරන ලද අදහස් වැරදි ආකාරයෙන් ගම්වල ප්‍රචාරය වීම හොඳ ක්‍රියාවක් නොවන බව ප්‍රකාශ කරන ලදී.

තමා එදා සිට අද දක්වාම රාජපක්ෂ නායකයින් සමඟ සිට කටයුතු කර ඇත. රට තුළ ඇති වී ඇති අර්බුදකාරී තත්ත්වයට වර්තමාන ආණ්ඩුව පමණක් වගකිව යුතු නොමැත. මෙකී ප්‍රශ්න, ගැටළු පෙර පැවැති ආණ්ඩු සියල්ලක්ගෙන්ම සිදු වී අවසානයේ වර්තමාන ආණ්ඩුව හමුවේ අර්බුදය ඇති වූ බැවින්, වර්තමාන ආණ්ඩුවට පමණක් දෝෂාරෝපණ එල්ල කිරීම වැරදි බව ප්‍රකාශ කරන ලදී.

තමා මහජන නියෝජිතයෙක් ලෙස මහා සභා කිහිපයකදීම පෙනී සිටින ලදී. ඒසේ පෙනී සිටි මහා සභා වාරයන්වලට වඩා, මෙකී පාලන කාලය තුළ සිදු කරන ලද සියලු කටයුතු නිවැරදිව සිදු කරන බව සඳහන් කළ යුතුය.

තිස්සමහාරාම ජනතාවගේ ඉන්ධන ප්‍රශ්න විසඳාලීම සඳහා පවතින ඉන්ධන පිරවුම් හල් සියල්ල සඳහා ඉන්ධන බවුසර් 01 ගානේ ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසට ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමා වෙතින් ඉල්ලීම් කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද රටවාසී සියලුම ජනතාව සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>**

වනජීවී නිලධාරීන් විසින් ගොවි ජනතාවගේ ඉඩම් ද නම් කර නව විදුලි වැටක් ගැසීමට සැලසුම් කරයි. එසේ සිදු කළහොත් දීර්ඝ කාලයක් ගොවිතැන් කටයුතු සිදු කරන ගොවි ජනතාවගේ ඉඩම් අහිමි වනු ඇත. එම නිසා විදුලි වැට ගැසීමේ දී යෝජිත විදුලි වැට ගැසීමට කටයුතු කළ යුතුය. නැතහොත් මෙකී කරුණ සඳහා ද ගොවි ජනතාවගේ විරෝධයක් ඇති විය හැකිය. මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටින ලදී.

මිල පාලනයන් නොමැතිකම නිසා වෙළඳසැල්වල විවිධ විවිධ මිල ගණන් යටතේ බඩු අලෙවි කිරීම මත, ජනතාව දැඩි අසරණභාවයකට පත්ව ඇත. මෙවැනි වෙළඳසැල් සම්බන්ධයෙන් ද සොයා බලා කටයුතු කළ යුතු බව දන්වා සිටින ලදී.

වෙළඳසැල්වල පොහොර රු. 40,000.00 ක් වැනි අධික මුදලකට අලෙවි කරනු ලබයි. මෙලෙස වැඩි මුදලකට අලෙවි කළ පසුව, ගොවි ජනතාව එකී පොහොර ලබා ගන්නේ කෙසේද. එම නිසා මේ

සම්බන්ධයෙන් ද අවධානය යොමු කර ගොවි ජනතාවට සහනදායි මුදලකට පොහොර ලබා ගැනීමට හැකි වන පරිදි යම් තීරණයක් දේශපාලන නායකයින් සමඟ සාකච්ඡා කර ලබා ගැනීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ උද්ගත වී ඇති තත්ත්වය සමඟ රටේ ජනතාව පාලනය කිරීම සඳහා ඇඳිරිනීතිය දැම්මද, ජනතාව පාරට බැස එම නීතිය ද හැල්ලු කරමින් කටයුතු කිරීම වැරදි ක්‍රියාවක් ලෙස මා දකින බව ප්‍රකාශ කරන ලදී.

ලබන්නා වූ 2022 අලුත් අවුරුද්ද රටවාසී සියලුම දෙනාට සුභම සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතාගේ අදහස් දැක්වීම</u>**

මේ දිනවල රට තුළ උද්ගත වී ඇති තත්ත්වය හමුවේ උද්ඝෝෂණ සිදු කළද, ඇතැම් අවස්ථාවල ජනතාව එම ස්ථානයන්වල ගී ගයමින්, ඉතාමත් විනෝදකාමීව සිටිනු ඇත. ඒවා සිදු කිරීමේ දී උද්ඝෝෂණ කටයුතු ද විහිළුවක් වී ඇති බව කිව හැකිය.

ඉන්ධන, ගෑස්, කිරි පිටි, පොහොර ප්‍රශ්න මූලික කර ගනිමින් ජනතාව උද්ඝෝෂණ සිදු කරනු ලබයි. මේ වන විට ජනතාව දැඩි අපහසුතාවයකට පත්ව ඇති තරමට, ජනතාවට සිංහල අලුත් අවුරුද්ද සඳහා සූදානම් වීමට නොහැකි තත්ත්වයන් උදා වී ඇති බව කිව හැකිය.

තිස්සමහාරාමය ගත් කළ තම කොට්ඨාසය ඉතාමත් දුප්පත් අසරණ මිනිසුන් ජීවත් වන ප්‍රදේශයකි. අසරණ පවුල් විශාල ප්‍රමාණයක් සිටී. එදා වේලට ආහාරයක් නොමැතිව එක් පවුලක් තුන්වේල සඳහාම මක්ඤෝක්කා ආහාරයට ගන්නා පවුල් සිටී. රටේ පවතින තත්ත්වයත් සමඟ අසරණ පවුල් මේ වන විට කෙතරම් අසරණ තත්ත්වයකට පත්ව ඇත්ද යන්න සිතිය හැකිය. එම නිසා ජනතාව පත්ව ඇති මෙම ගැටළුකාරී තත්ත්වයෙන් මුදවා ගැනීමට සියලුම නායකයින් එකට එක්ව නිවැරදිව කටයුතු කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

අද වන විට රටට උදා වී ඇති තත්ත්වය දිගින් දිගටම පැවතියහොත්, අප සියලුම දෙනාට රටක් අහිමි වනු ඇත. එම නිසා අප සියලුම දෙනා එක්ව රට ගොඩනැගීම සඳහා නිවැරදි ගමනක් ආ යුතු සේම, නිවැරදි තීන්දු තීරණ ලබා ගත යුතුය. එලෙසට නිවැරදි තීන්දු තීරණ ලබා ගෙන නිවැරදි ගමනක් යාමට රටේ සියලුම පාලකයන්ට හැකි වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

ලබන්නා වූ සිංහල අලුත් අවුරුද්ද රටවාසී සියලුම ජනතාවට සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>**

පක්ෂ වශයෙන් විවිධ දේශපාලන මත තිබුණත් අප සභාවේ සියලුම දෙනා ජනතාව වෙනුවෙන් එකට එක්ව කටයුතු කළ යුතුය.

අද දින මුළු රටේම රාජ්‍ය යාන්ත්‍රණය වැඩ වර්ජනයක් සිදු කළද, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ නිලධාරීන් සියලුම දෙනා අද දින සේවයට පැමිණ සිදු කරන ලද ක්‍රියාව අප සියලුම දෙනාට ලබා දෙන අභිමානයකි. ඒ වෙනුවෙන් ලේකම්තුමිය ඇතුළු සියලුම නිලධාරී/ සේවක මහත්ම මහත්මීන් වෙත අප සියලුම දෙනාගේ ගෞරවණීය ස්තූතිය පුද කරන ලදී. එසේම මෙම නිලධාරීන් අද දින සේවයට පැමිණ සිදු කළ කැපකිරීම තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවටම ගෞරවයක් ගෙන දෙන්නක් බව ප්‍රකාශ කරන ලදී.

පසුගිය දිනක තිස්සමහාරාමයේ සිදු කරන ලද උද්ඝෝෂණ රැල්ල ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ නිවස අසලට ගොස් සිදු කිරීම අනුමත කළ නොහැක. වෙහෙරගල, මව්ආර, උමාඔය, අට්ටික්කා අමුණ ආදිය තිස්සමහාරාම ජනතාවට දායාද කරන ලද්දේ ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාය. එවැනි උතුම් මිනිසෙකුගේ නිවස අසල උද්ඝෝෂක පිරිස ගොස් පරුෂ වචනයෙන් කෑ කෝ ගැසීම වැරදි ක්‍රියාවකි. මෙම පිරිස ගොස් එම ස්ථානයේ ප්‍රකාශ කරන ලද පරුෂ, වැරදි වචනවලින් ගරු එතුමන්ගේ නමට හෝ කැළලක් සිදු වුයේ නම් ඒ සම්බන්ධයෙන් තමාගේ දැඩි කණගාටුව ප්‍රකාශ කරන ලදී.

උද්ඝෝෂණ රැල්ල අවස්ථාවේ එම පිරිස ප්‍රාදේශීය සභාව අසලද විරෝධය දැක්වීමට පැමිණීමට සැලසුම් කළ පසුව, ගරු සභාපතිතුමා යන පුද්ගලයා ඉතාමත් හොද මනුශ්‍යත්වය පිරි උතුම් මිනිසෙකු යනුවෙන් කියා, සභාවට පැමිණීම වැළකුණද, ඉන් අනතුරුව ගරු අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමාගේ නිවස අසලට ගොස් ඉතාමත් වැරදි විදියට හැසිරී ඇති බවත්, එය ඉතාමත් වැරදි ක්‍රියාවක් ලෙසත් තමා දකින බව ප්‍රකාශ කරන ලදී.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා යනු රටේ සියලුම ජනතාවට නිදහසේ හුස්ම ගැනීමට වටපිටාව සකස් කර දුන් උතුම් නායකයෙකි. ගරු එතුමන්ට මේ දිනවල ජනතාව විසින් නින්දා, අපහස කිරීම් අගෞරව කිරීම් පිළිබද තමා දැඩි ලෙස කණගාටු වන බව ප්‍රකාශ කරන ලදී.

අප සභාව තුළ වසරක් තුළ ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් ඇතුළත් කර අයවැයක් සකස් කර, එය කළමනාකරණය කර ගනිමින් සැලසුම් සහගතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. රටේ සිදු කළ යුතු සෑම කාර්යයක්ම සිදු කළ යුත්තේ දේශපාලන අංශ නොවේ. රට තුළ සියලුම රාජ්‍ය යාන්ත්‍රණය කළමනාකරණයකින් යුතුව සැලසුම් සහගතව කටයුතු සිදු කරන්නේ නම් රට තුළ මෙවැනි ගැටළු ඇති නොවන බව ප්‍රකාශ කරන ලදී.

ගමක් ගත් කළ එකී ගමේ එක් එක් කාර්යයන් සොයා බලා ඉටු කිරීමට රාජ්‍ය නිලධාරීන් 06 දෙනෙක් සිටියද, මෙම නිලධාරීන්ගේ සේවය 100% ක්ම ලබා දෙන බව කිව නොහැක. එම නිලධාරීන්ගේ සේවය 100% ක්ම ලබා දීමට කටයුතු කරන්නේ නම්, ගම තුළ ප්‍රශ්න, ගැටළු ඇති නොවනු ඇත. එලෙසට රට පුරාම තිබෙන ගම්මානවල තිබෙන ප්‍රශ්න, ගැටළු පිළිබදව මෙම නිලධාරීන් සොයා බලා කටයුතු කරන්නේ නම්, රටේ සියලුම ජනතාවට කිසිදු ප්‍රශ්නයක් ඇති නොවන බව දන්වා සිටින ලදී.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ කටයුතු නිවැරදිව, අණ පනත්වලට යටත්ව සිදු කරන ලද හොද සභාවක් ලෙස දන්වා විගණන දෙපාර්තමේන්තුව විසින් මතයක් ලබා දී ඇත. අප පාලන කාලය තුළ සිදු කරන්නා වූ සෑම කාර්යක්ම නිවැරදිව සිදු කර ඇති බවට විගණන දෙපාර්තමේන්තුවෙන් ද දන්වා තිබීම අප සියලුම දෙනාට සතුටු විය හැකි බව ප්‍රකාශ කරන ලදී.

අප සභාවේ සුභ සාධක සමිතියට ආධාර පිණිස පවත්වනු ලැබූ වෙළද සැණකෙළිය මගින් ලැබුණු ආදායමින් සභාවේ සේවය කරන නිලධාරී/ සේවක මහත්ම මහත්මීන්ගේ සුභ සාධන උදෙසා සුභ සාධක කඩයක් ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කර ඇති බවත්, එම මුදලින් සියලුම නිලධාරී/සේවක මහත්ම මහත්මීන් සදහා සිංහල අලුත් අවුරුද්දට වැටුපෙන් අය කර ගැනීමේ පදනම මත රු. 10,000.00 ක ණය මුදලක් ලබා දුන් බවත් ප්‍රකාශ කරන ලදී.

තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව විසින් රචනා කර මුද්‍රණය කර ලද ''මාගම්පත්තු පුරාණය 01'' කෘතිය අලෙවි කර ගැනීම සදහා ගරු සභිකයින් සියලුම දෙනා සහායක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී. එම කෘතිය අලෙවි කර ගන්නා මුදල් ද සේවකයින්ගේ සුභ සාධනය උදෙසා යෙදවීමට තීරණය කර ඇති බව ප්‍රකාශ කරන ලදී.

මහජන නියෝජිතයින් ලෙස ජනතාවගේ මනාපයෙන් පත් වූ අප ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා සෑම විටකම කටයුතු කළ යුතුය. අප පත් වූ කාල සීමාව තුළ අද දක්වා කොපමණ බාධක පැමිණියත් ජනතාව වෙනුවෙන් සිදු කර ඇති සේවාවන් වෙනුවෙන් සතුටු විය හැකිය. ජනතාවට සිදු

කරන්නා වු සේවාවන් වෙනුවෙන් යම් පිනක් අපට ලැබෙන්නේ නම්, එකී පිං මහිමය සභාවේ සියලුම ගරු සභිකයින් වෙතද හිමි වන බව දන්වා සිටින ලදී.

රට තුළ අද වන විට උද්ගත වී ඇති අර්බුදකාරී තත්ත්වයන් සමනය කර රට යථාතත්වයට පත් කර ගැනීමටත් අලුත් රටක් ගොඩ නැගීමටත් අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළු සියලුම දේශපාලන නායකයින්ට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

දැනට පවතින අර්බුදකාරී තත්ත්වයන් හමුවේ වුවත් අප රටේ සියලුම ජනතාව හැකි අයුරින් සිංහල අලුත් අවුරුද්දට සුදානම් වෙමින් සිටී. කුමන ප්‍රශ්න, ගැටළු ඇති වුවත් සිංහල අලුත් අවුරුද්ද රටවාසී සියලුම ජනතාවට සුභම සුභ අලුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරන අතර, රටේ ජනතාවට මතු වී තිබෙන සෑම ප්‍රශ්නයක්ම හෙට දවසේ විසදා ගැනීමට හැකි වේවායි කියා ප්‍රාර්ථනා කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා මාධ්‍යවේදීන් දෙපල, ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 03.45 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.



සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.04.08 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.